# 2023

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
இலங்கை புத்தாக்குனர் ஆணைக்குழு
**SRI LANKA INVENTORS COMMISSION**

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சு
Ministry of Science & Technolog

---

5th Floor, "Mehewara Piyasa" Building, Colombo 05
Tel:011-2676650, Fax: 011-2676646
Website: www.slic.gov.lk, Mail: info@slic.gov.lk




# වාර්ෂික වාර්තාව 2023

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

විද්‍යුත් ලිපිනය: info@slic.gov.lk
වෙබ් අඩවිය: www.slic.gov.lk

දුරකථන: 0112676650/ 0112676645
ලිපිනය: 5 වන මහල,
"මෙහෙවර පියස" ගොඩනැගිල්ල,
කොළඹ 05

# පටුන


| | පිටුව |
|---|---|
| කොමිසමෙහි සාමාජිකයින් | 4 |
| විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් | 5 |
| කොමසාරිස්තුමාගේ පණිවිඩය | 6-7 |
| හිටපු කොමසාරිස්තුමාගේ පණිවිඩය | 8 |
| අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය | 9-10 |
| 1. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම | |
| 1.1 හැඳින්වීම | 11 |
| 1.2 දැක්ම | 11 |
| 1.3 මෙහෙවර | 11 |
| 1.4 පරමාර්ථ | 11 |
| 1.5 කොමිසමේ බලතල, කර්තව්‍ය හා කාර්යයන් | 11-12 |
| 1.6 ආයතනික සැලැස්ම | 13 |
| 1.7 මානව සම්පත් | 14 |
| 1.8 කොමිසමේ පාලක මණ්ඩලය හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් | 15 |
| 2. 2023 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘති සහ වැඩසටහන් | 16 |
| 2.1 ජාත්‍යන්තරය හා ශ්‍රී ලංකාව නවෝත්පාදනයෙන් යා කරන, "සහසක් නිමැවුම්" අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සහ තරඟාවලිය | 16 |
| 2.1.1 "සහසක් නිමැවුම්" හි ප්‍රගතිය | 17 |
| 2.1.2 "සහසක් නිමැවුම්" අන්තර්ජාතික තරඟාවලිය | 18-19 |
| 2.2 නව නිපැයුම් වාණිජකරණය සඳහා වන මූල්‍ය සහන වැඩසටහන් | 19 |
| 2.3 නව නිපැයුම්කරුවන්ට තාක්ෂණික සහයෝගය ලබාදීම වෙනුවෙන් ස්ථාපිත තාක්ෂණික බීජෞෂණ මධ්‍යස්ථාන (Technology Incubation Centers) | 20 |
| 2.4 ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සහ BCS the Charted Institute for IT Sri Lanka Section සහයෝගීතාවය | 20-21 |
| 2.5 කෘෂිකර්මයට අදාල නව නිපැයුම් ඇගයීම සහ ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 21 |
| 2.6 රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය | 21 |
| 2.7 නව නිපැයුම්කරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වැඩමුළු | 21 |
| 2.8 ශ්‍රී ලාංකේය නවෝත්පාදන සංස්කෘතියක ඉදිරි ගමන උදෙසා යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීම | 22-23 |
| 2.9 යොවුන් නව නිපැයුම් දිරිගන්වන "Sri Lanka Inventors Commission YouTube චැනලය සහ facebook පිටුව | 24 |
| 2.10 දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ අයිතීන් සුරැකීමට නිපැයුම්කරුවන්ට සහාය | 24-25 |
| 2.10.1 බුද්ධිමය දේපල ලබාදීමට පහසුකම් සැලසීම | 25 |
| 2.11 ජාත්‍යන්තර රටවල පේටන්ට් අයදුම්කිරීම සඳහා සහාය ලබා ගැනීමේ ක්‍රමවේදය | 25 |
| 2.12 නව නිපැයුම්කරුවන් ආයෝජකයින් හා සම්බන්ධ කරවීම | 25-26 |
| 2.13 අනාගතය සඳහා වන ඒකාබද්ධ ව්‍යාපෘති | 26 |

| | | |
|---|---|---|
| 2.13.1 | තරුණ නව නිපැයුම්කරු - ව්‍යවසායක නායකත්ව සංවර්ධන වැඩසටහන (Young Inventors – Entrepreneur Lead Development - YIELD) | 26 |
| 2.13.2 | මාර්ග අනතුරු සංඛ්‍යාව අවම කර ගැනීම සඳහා වන නව නිපැයුම් සහ නවෝත්පාදන තරඟය | 27 |
| 2.14 | නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන පිරිනැමීම | 27 |
| 2.15 | නව නිපැයුම්කරුවන්ගේ හමුව | 28 |
| 2.16 | විද්‍යා දිනය සැමරීම | 28 |
| 2.17 | අන්තර්ජාතික පිළිගැනීම | 29 |
| 2.18 | ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය | 29 |
| 2.19 | නව නිපැයුම් ප්‍රචලිත කිරීමේ වෙනත් වැඩසටහන් | 29 |
| 2.19.1 | "Sri Lanka Inventors" - YouTube ප්‍රවේශය | 29-30 |
| 2.19.2 | “Inventor Champs” නවෝත්පාදන ප්‍රවේශයේ පාසල් වේදිකාව | 30-31 |
| 2.20 | මාධ්‍ය දායකත්වය | 31 |
| 2.21 | SLIC-SPAR Sri Lanka ව්‍යාපෘතිය | 31 |
| 2.22 | “මෙහෙවර පියස” මාසික පොළ | 32 |
| 2.23 | ආහාර තාක්ෂණයට අදාල නව නිපැයුම් වාණිජකරණය | 32 |
| 2.24 | සතුටු පවුල වෙළඳ ප්‍රදර්ශනය | 32-33 |
| 2.25 | පේටන්ට්ලාභී නව නිපැයුම්කරුවන් වෙනුවෙන් 2023 වසරේදී ලබාදුන් සහයෝගයන් | 33 |
| 2.26 | වාණිජකරණය කරන ලද නව නිර්මාණ 2023 වර්ෂයේදී ලැබූ ප්‍රගතිය | 33-35 |
| 2.27 | මානව සම්පත් සංවර්ධනය | 35 |
| 2.28 | පෙර වසර 10ට අදාළ මූල්‍ය හා සම්බන්ධ සුවිශේෂී කරුණු | 36-39 |
| 3. | සංයුතික පාලන වාර්තාව | 40 |
| 4. | මූල්‍ය ප්‍රකාශනය | 41-60 |

## කොමිසමෙහි සාමාජිකයින්

මහාචාර්ය එන්. එම්. එස්. සිරිමුතු මහතා
**කොමසාරිස්**
(2023.01.01 සිට 2023.05.01)

එස්. කේ. සිරිල්. සුදුවැල්ල මහතා
**කොමසාරිස්**
(2023.07.12 සිට 2023.12.31)

වෛද්‍ය ආර්. එම්. එච්. එම්. අනූප ඉන්දික හේරත් මහතා
**සහකාර කොමසාරිස්**
(2023.01.01 සිට 2023.04.26)

කල්පනී රාජපක්ෂ මිය
**සහකාර කොමසාරිස්**
(2023.01.01 සිට 2023.12.31)

ඩී. ඩී. ආනන්ද නාමල් මහතා
**සහකාර කොමසාරිස්**
(2023.07.12 සිට 2023.12.31)

එම්. කේ. ඩී. එන්. මාදම්පේ මිය
**භාණ්ඩාගාර නියෝජිත**
(2023.01.01 සිට 2023.12.31)

**විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්**

එම්. කේ. ඩී. එන්. මාදම්පේ මිය
**භාණ්ඩාගාර නියෝජිත**
(2023.01.01 සිට 2023.12.31)

වෛද්‍ය ආර්. එම්. එච්. එම්. අනුප ඉන්දික හේරත් මහතා
**සහකාර කොමසාරිස්**
(2023.01.01 සිට 2023.04.26)

කල්පනී රාජපක්ෂ මිය
**සහකාර කොමසාරිස්**
(2023.01.01 සිට 2023.12.31)

ඩී. ඩී. ආනන්ද නාමල් මහතා
**සහකාර කොමසාරිස්**
(2023.07.12 සිට 2023.12.31)

එච්. ඩී. අනුරුද්ධිකා මහත්මිය
**ප්‍රධාන අභ්‍යන්තර විගණක**
(2023.01.01 සිට 2023.12.31)

පී. ඒ. ඩී. ආර්. කේ. වික්‍රමතිලක මහතා
**විගණකාධිපති දෙපාර්තමේන්තු නියෝජිත**
(2023.01.01 සිට 2023.12.31)

**කොමසාරිස්තුමාගේ පණිවිඩය**



**එස්. කේ. සිරිල් සුදුවැල්ල**
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කොමසාරිස්

1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතින් ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමෙහි අපේක්ෂිත මුඛ්‍ය පරමාර්ථය වනුයේ දේශීය නවෝත්පාදනය දිරිගන්වමින් නව නිපැයුම්කරුවන් සඳහා අවශ්‍ය තාක්ෂණික, මූල්‍යමය හා නෛතික සහයෝගය ලබා දීමට කටයුතු කිරීමයි.

නව නිපැයුම් සහ නූතන ලෝකයේ දියුණුව සමඟ පවතිනුයේ එකිනෙක අතර ඍජු සම්බන්ධතාවයකි. අතීතයෙහි බිහිවූ නව නිපැයුම් වර්තමානය වන විට ඉතිහාසයට එක් වූ නිෂ්පාදනයන්ම පමණක් බවට පත්ව ඇත. එසේ වුව ද නව නිපැයුම් යනු යුග ගණනාවක සිට පැවත එන විවිධ තරාතිරමේ විද්‍යාඥයන්, අධ්‍යාපනවේදීන් මෙන්ම සිවිල් ජනතාවගේද නිරන්තර උත්සාහයන් හා කැපවීම් මෙන්ම ඔවුනගේ සුසංයෝජනයන්හි ප්‍රතිඵලයන් මිසක කිසිසේත් තනි පුද්ගලයකු හෝ තනි කණ්ඩායමක් තුලින් ලද ජයග්‍රහණයන් නොවේ.

මේ වන විට ලෝක ආර්ථිකයේ පසුබෑම මත නව නිපැයුම් සඳහා වන ආයෝජන අවස්ථාන් අවම වී ඇති නමුත් නව නිපැයුම් සඳහා වන වෙළදෙපොළ අවස්ථාන් පෙරටත් වඩා විවෘතව පවතී. මෙම තත්ත්වය ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම හොඳින් හඳුනාගෙන දේශීය නව නිපැයුම්කරුවන්ට එම වෙළඳපොළ ජයගැනීමට අවස්ථාවන් සැලසීම උදෙසා කොමිසම විසින් නව යෝජනා ඉදිරිපත් කොට ඇති අතර එමඟින් නව නිපැයුම් වාණිජකරණය සඳහා මං පෙත් විවර කර ඇත.

කොමිසම ස්ථාපිත කර ඇති පනත ප්‍රකාරව දේශීය නව නිපැයුම්කරුවන් සඳහා තාක්ෂණික හා මූල්‍යමය සහාය ලබාදීම වෙනුවෙන් වාණිජකරණ විභවයක් සහිත නව නිපැයුම් වෙළඳපොළ වෙත රැගෙන යෑම පාදක කරගනිමින් "IAFM -SL"(Innovation Accelerator Funding Mechanism for Sri Lanka) හා "නව නිපැයුම් දිරිය " නමින් ව්‍යාපෘති ද්විත්වයක් හඳුන්වා දී ඇත. මෙහිදී විශේෂඥ විනිසුරුවන්ගේ ඇගයීම අනුව හඳුනාගත් යෝග්‍ය වූ නිපැයුම් වෙනුවෙන් මූල්‍ය හා තාක්ෂණික සහයෝගය ලබා දීම සිදුකරනු ලබයි. මීට අමතරව නව නිපැයුම් වාණිජකරණය දිරිමත් කරලීමේ අරමුණ පෙරදැරි කරගනිමින් නව බැංකු ණය ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත.

වත්මන් වෙළඳපොළ සාර්ථකව ජයගැනීම උදෙසා මේ වන විට කොමිසම මඟින් නව නිපැයුම්කරුවන්ගේ පර්යේෂණ අවශ්‍යතා වෙනුවෙන් සෙසු ආයතන වෙත යොමු කිරීම සහ විශ්වවිද්‍යාල පද්ධතිය සමඟ එක්ව කටයුතු කිරීමට අවස්ථාව සලසා දීම මඟින් සාර්ථකව නව නිපැයුම් බිහිකිරීමට නව නිපැයුම්කරුවන්ට අවස්ථාව සැලසී ඇත.

තව ද නව නිපැයුම්වල සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීම සඳහා බුද්ධිමය දේපළ අයිතිය (පේටන්ට් බලපත්‍රය) ලබා ගැනීම සම්බන්ධයෙන් නව නිපැයුම්කරුවන්ට මාර්ගෝපදේශකත්වය ලබාදීමේ විශේෂිත වැඩපිළිවෙලක් මෙම වසරේ කොමිසම විසින් ක්‍රියාත්මක කල හෙයින් දේශීය නිපැයුම්කරුවන්ට ඔවුන්ගේ නව නිපැයුම් සඳහා බුද්ධිමය දේපල හිමිකම තහවුරු කර ගැනීමට හැකියාව ලැබුණි.

කොමිසම සහ ශ්‍රද්ධා මාධ්‍ය ජාලය අත්වැල් බැඳගනිමින් ශ්‍රී ලාංකේය අනාගත ශ්‍රම බලකාය වන පාසල් ප්‍රජාව ඉලක්ක කර ගනිමින් සංවිධානය කරනු ලබන "Inventor Champs" වැඩසටහන මඟින් යොවුන් නව

නිපැයුම්කරුවන් දිරිගන්වමින් ඔවුන්ගේ නිර්මාණශීලිත්වය ජනතාව අතරට ගෙනයෑමටත්, එමඟින් නවෝත්පාදන කෙරෙහි පාසල් ප්‍රජාව නැඹුරු කරවීමටත් මේ වන විට කොමිසමට හැකියාව ලැබී ඇත.
තව ද කොමිසම මඟින් නිපැයුම්කරුවන් සඳහා ජනාධිපති සම්මාන පිරිනැමීම, ශක්‍යතා වර්ධනය වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කරවීම, ජාත්‍යන්තර තරඟ සඳහා යොමු කරවීම, ඔක්තෝබර් මස 26 දිනට යෙදී ඇති ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය සැමරීම, නව නිපැයුම්කරුවන් වෙනුවෙන් හැඳුනුම්පත් නිකුත් කිරීම, නව නිපැයුම් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ආදි වශයෙන් සුවිශේෂී කාර්යභාරයන් රැසක් ඉටුකිරීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට හැකියාව ලැබී ඇත.

මෙම සෑම කාර්යයක් සඳහාම පාලක මණ්ඩලයේ මහ පෙන්වීම මත කොමිසම සතුව පවතින ඉතාමත් සීමිත වූ කාර්ය මණ්ඩලයේ දායකත්වය අපරිමිතව හිමිවන අතර, වැඩසටහන් වල සාර්ථකත්වය සඳහා එය ප්‍රභල සාධකයක් බවට පත්ව තිබේ. රාජ්‍ය ආයතනයක් වශයෙන් කොමිසම වෙත පැවරී ඇති කාර්යභාරය නිසි ලෙස ඉටුකරමින් ශ්‍රී ලංකේය නව නිපැයුම්කරුවන්ගේ හෙට දවස උදෙසා සුවිසල් සේවයක් ඉටුකළ, ඉටුකරන්නාවූ සියලුම දෙනා වෙනුවෙන් කෘතවේදීත්වය පිරිනමන අතර, ඉදිරියේදී ලාංකේය අනන්‍යතාවය ලෝකයේම පැසසුමට ලක් කරන්නාවූ නව නිපැයුම් බිහිකරමින් රට තුල නවෝත්පාදන සංස්කෘතියක් ප්‍රචලිත කිරීමට දේශීය නව නිපැයුම්කරුවන්ට අවස්ථාව සැලසේවායි! සුභාශිංසන පිරිනමමි.

## හිටපු කොමසාරිස්තුමාගේ පණිවිඩය



**මහාචාර්ය එන්. එම්. එස්. සිරිමුතු**
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කොමසාරිස්

ලෝකයේ බොහෝ රටවල නව නිපැයුම් හා නව නිපැයුම්කරුවන් ආර්ථික පෙරළියක් ඇති කළ එක් ප්‍රධාන සාධකයකි. යම් රටක නව නිර්මාණ බිහි නොවන්නේ නම් එම රටේ සංවර්ධනය අඩාල වන්නාක් මෙන්ම අලුත් අලුත් දේවල් සොයා ගැනීම හේතුවෙන් ලෝකයේ සියලුම රටවල් විවිධ අංශ වලින් දියුණු විය. ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් අනාගත ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාදාමයට සෘජුවම දායක කර ගැනීම ජාතික අවශ්‍යතාවයකි. විශේෂයෙන් දේශිය සම්පත් උපයෝගී කරගෙන දේශීය නව නිපැයුම් හා ඒ ආශ්‍රිත කර්මාන්ත නඟා සිටුවීම සඳහා ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් හට වැඩි අවස්ථාවක් උදාකර දීම අපගේ යුතුකමකි.

ශ්‍රී ලාංකික නිර්මාණශීලි පුද්ගලයන්ගේ අදහස් ක්‍රියාවට නැංවීම සඳහාත්, ආයෝජකයන් වෙත හඳුන්වාදීම සඳහාත් නව නිපැයුම් වැඩිදියුණු කිරිමේ හා ආයෝජන අවස්ථා සැලසීමේ ව්‍යාපෘති 2023 වර්ෂයේදී කොමිසම වෙත පැවරී තිබු බලතල අනුව කාර්යමණ්ඩලයේ කැපවීම හා රේඛීය අමාත්‍යාංශයේ මඟ පෙන්වීම මත මුළු දිවයිනම ආවරණය වන පරිදි පාසල්, විශ්වවිද්‍යාල හා තෘතියික අධ්‍යාපන ආයතන, විවෘත හා වාණිජකරණ යනුවෙන් හඳුනාගත් අංශ 04 ක් සඳහා තාක්ෂණික ක්ෂේත්‍ර 14 ක් ඉලක්ක කර ගනිමින් නව නිපැයුම් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කර ඇත.

ශ්‍රී ලාංකිකයන්ගේ නව නිපැයුම් කුසලතා වැඩිදියුණු කිරීමේ, පෝෂණය කිරීමේ කේන්ද්‍රස්ථානය වශයෙන් ශ්‍රී ලාංකීය අනන්‍යතාවයෙන් යුතු නව නිපැයුම් වලින් පරිපූර්ණ නව නිපැයුම් සංස්කෘතියක් බිහිකිරීමේ අරමුණ පෙරදැරිව ගමන් කිරීම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ අපේක්ෂාවයි. එම අපේක්ෂාව යථාර්ථයක් බවට පත් කරගැනීමට යන ගමනේදී අප හට අත්වැලක් වූ සියල්ලන් වෙත කෘතවේදීත්වය පිරිනැමීම සඳහා මෙය මහඟු අවස්ථාවක් කර ගනිමි.

## අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය



එන්. එන්. ඩබ්. දොලවත්ත මයා
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ අධ්‍යක්ෂ

දේශීය ආර්ථිකය නගා සිටුවීම සඳහා නව නිපැයුම් සහ නවෝත්පාදන වල දායකත්වය ඉතාමත් අවශ්‍ය අවධියකදී නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමේ ඒකායන අරමුණින් වර්ෂ 1979 අංක 53 දරණ ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත මඟින් ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට සුවිශාල කාර්යයභාරයක් පැවරී ඇති බව අපගේ ඒකායන අදහස වේ.

මේ සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ණ අනුග්‍රහය සහ මඟපෙන්වීම මත සුවිශාල කාර්යයභාරයක් ඉටුකරමින් සිටියි. පැවති අභියෝගාත්මක වාතාවරණය තුළ භාණ්ඩාගාර ප්‍රතිපාදන සීමිත වීම නොවැළැක්විය හැකි කරුණක් වුවද කොමිසම මඟින් නව තාක්ෂණය හා අනුගත වෙමින් වැඩසටහන් මාර්ගගත තාක්ෂණය ඔස්සේ පැවැත්වීම මඟින් කොමිසම විසින් ලබාදෙන ලද සේවාව අඛණ්ඩව 2023 වසරේදී ද ලබාදීමට කටයුතු කිරීම මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුවේ.

තව ද විදේශ ආනයන සඳහා පැනවූ සීමාවන් තුළ දේශීය වෙළඳපොළ තුළ මතුවූ අවස්ථාවන්ද මනාව කළමනාකරණය කරගනිමින් ස්පාර් ශ්‍රී ලංකා සුපිරි වෙළඳසැල් ජලය හා ඒකාබද්ධව දේශීය නව නිපැයුම් වාණිජකරණය කර ගුණාත්මක බවින් යුතු නව නිෂ්පාදන රාශියක් වෙළඳපොළ වෙත හඳුන්වා දීමටද කටයුතු කරන ලදි.

රාජ්‍ය සහ පිළිගත් පුද්ගලික ආයතන හා මනාව සම්බන්ධීකරණය වෙමින් නව වැඩසටහන් කිහිපයක් ආරම්භ කිරීමට කොමිසමට හැකියාව ලැබුණු අතර මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සමඟ ආරම්භ කරන ලද මාර්ග ආශ්‍රිත අනතුරු අවම කර ගැනීම සඳහා වන ව්‍යාපෘතිය, ශ්‍රද්ධා මාධ්‍ය ජාලය සමඟ ආරම්භ කරන ලද පාසල් දරුවන්ගේ නවෝත්පාදන කුසලතා ප්‍රවර්ධනය කරන "Inventor Champs" රියලිටි තරඟාවලිය, ලෝක ප්‍රසිද්ධ ජර්මානු සීමෙන්ස් (Simens) තාක්ෂණික ආයතනයේ දේශීය නියෝජිත වන පැනසියා පුද්ගලික ආයතනය හා සම්බන්ධ වෙමින් දේශීය දූවා දරුවන්ගේ නවෝත්පාදන කුසලතා ඔප් නැංවීමේ අරමුණින් ආරම්භ කරන ලද "YEILD" වැඩසටහනද මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු වේ.

අදාල මූල්‍ය වර්ෂය තුල කොමිසමේ වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා පිළිගත් පුද්ගලික ආයතන කිහිපයකින්ම මූල්‍ය අනුග්‍රහය ලබා ගැනීමට කොමිසම කටයුතු කළ බව ද සඳහන් කරන අතරම අනුග්‍රහයන් ලබාදුන් බ්‍රැන්ඩික්ස්, ඩී එස් අයි, පැනසියා පුද්ගලික ආයතනය මෙන්ම ආර්පිකෝ ආයතනයද මෙහිදී කෘතවේදීව සිහිපත් කරමි.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් වර්ෂ 2012 දී ආරම්භ කරන ලද "සහසක් නිමැවුම්" නව නිපැයුම් සහ නවෝත්පාදන තරඟාවලි තුළින් හඳුනා ගන්නා ලද නව නිපැයුම්කරුවන් දේශීය ආර්ථිකය සඳහා ශක්තිමත් දායකත්වයක් දක්වා ඇත.

මෙසේ දේශීය ආර්ථිකය සඳහා සක්‍රීය දායකත්වයක් 2023 වර්ෂය තුළදී ලබාදුන් ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන්ගේ දළ විස්තරයක් මෙම වාර්ෂික වාර්තාවට අන්තර්ගත කර ඇත.

මෙම මූල්‍ය වර්ෂය තුළදී ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිහාල් රණසිංහ මහතා, අතිරේක ලේකම් සමන්ති වීරසිංහ මිය, අධ්‍යක්ෂක ජනරාල්(සැලසුම්) කුමාරි මීගහකොටුව මිය ඇතුළු, විශ්‍රාමික අධ්‍යක්ෂ ජනරාල් පී. එම්. ධර්මතිලක මයා ඇතුළු සියලු අමාත්‍යාංශ නිළධාරීන්ගේ සහයෝගය නොඅඩුව ලැබුනු බව කෘතවේදීව සිහිපත් කරමි.

කොමිසම මඟින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා සක්‍රීය දායකත්වයක් දැක්වූ සියලුම පාර්ශවයන් මෙහිදී කෘතවේදීව සිහිපත් කරන අතරම සමස්ත ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන් වෙත කොමිසමේ ප්‍රණාමය පළකරමි.

තව ද කොමිසමෙහි සාර්ථකත්වය සඳහා නිබඳව සහයෝගය දක්වන කොමසාරිස්තුමා ඇතුළු පාලක මණ්ඩලයේ සාමාජික, සාමාජිකාවන් වෙත අපගේ හෘදයාංගම කෘතවේදීත්වය පළකරන අතර විෂයභාර ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ නොමඳ සහයෝගය අදාල වර්ෂය තුලදී කොමිසමේ සාර්ථකත්වය සඳහා දායක වූ බව කෘතවේදීව සිහිපත් කරමු.

අවසාන වශයෙන් මෙවැනි අභියෝගාත්මක වාතාවරණයක් තුළ වුවද දේශීය ආර්ථිකය සඳහා දායකත්වයක් දක්වන ලද සියළුම නව නිපැයුම්කරුවන් වෙත කොමිසම සුභාසිංශන පළකරන අතර අනෙකුත් නව නිපැයුම්කරුවන්ටද කොමිසම හා එකතුව දේශීය ආර්ථිකය නඟා සිටුවීම සඳහා දායක වන මෙන් ආරාධනා කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමු.

# 1. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

## 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම දේශීය නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් දිරිගැන්වීම, ප්‍රවර්ධනය සහ නිෂ්පාදනය දිරි ගැන්වීමත්, ඒවාට සම්බන්ධ අනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමත් වෙනුවෙන් 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. වර්තමානයේ කොමිසම අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

## 1.2 දැක්ම

"නව නිපැයුම් මවන දැයක් - යස ඉසුරින් පිරුණු හෙටක්"
(නව නිපැයුම් හා නවෝත්පාදන තුලින් සෞභාග්‍යය උදා කිරීම)

## 1.3 මෙහෙවර

ශ්‍රී ලාංකිකයින්ගේ නවෝත්පාදන හැකියාවන් ප්‍රවර්ධනය කරවීම ප්‍රධාන උත්ප්‍රේරකය ලෙස ක්‍රියා කරමින්, අදහස් ප්‍රායෝගික යෙදවුම් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීමේ පුරෝගාමියා ලෙස කටයුතු කිරීම.

## 1.4 පරමාර්ථ

1.4.1 ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් නිර්මාණය කරනු ලබන නව නිපැයුම් සඳහා ධෛර්යය දීම.

1.4.2 නව නිපැයුම්කරුවන්ට තාක්ෂණික, මුල්‍ය හා නීති ආධාර ලබා දීම.

1.4.3 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ සඳහන් සියලු බලතල, කර්තව්‍යය හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම.

1.4.4 ඉහත දක්වා ඇති පරමාර්ථ මුදුන්පත් කිරීම සඳහා අවශ්‍ය වන හෝ උපකාරී වන වෙනත් සියලු කටයුතු කිරීම.

## 1.5 කොමිසමේ බලතල, කර්තව්‍යය හා කාර්යයන්

(අ) කොමිසමේ නියමයන්ට හා කොන්දේසීන්ට යටත්ව, නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර අයදුම් කිරීමේදී අදාල කරුණු පරීක්ෂා කර බලා ඒ ඒ නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික ආධාර ලබාදීම සහ පේටන්ට් අයදුම් පත පිළියෙල කිරීම වෙනුවෙන් උපකාර කිරීම.

(ආ) පේටන්ට් බලපත්‍ර නිකුත් කර ඇති නව නිපැයුම් හෝ පේටන්ට් අපේක්ෂිත නව නිපැයුම් වැඩි දියුණු කිරීම, පරිපූර්ණ කිරීම හා නිෂ්පාදනය කිරීම සඳහා කොමිසමේ නියමයන්ට යටත්ව මුදල් ආධාර ලබා දීම.

(ඇ) නව නිපැයුම්කරුවන්ගේ පේටන්ට් බලපත්‍ර දේශීයව හෝ විදේශීයව ඉදිරිපත් කිරීමේ දී ඔවුන් නියෝජනය කිරීමෙන් සහ පේටන්ට් අයිතීන් උල්ලංඝනය කිරීම්වලදී මෙන්ම පේටන්ට් අයිතිය පිළිබඳ නඩු වල දී ඔවුන් ආරක්ෂා කිරීම සඳහා නීති ආධාර දීම.

(ඈ) නව නිපැයුම්වල ගුණාත්මකභාවය මත පදනම්ව එම පේටන්ට් අයිතීන් පමණක් ඇපයට තබාගනිමින් රාජ්‍ය ණය දෙන ආයතන වෙතින් නව නිපැයුම්කරුවන්ට දීර්ඝ කාලීන ණය ලබාගැනීමට හැකි වන පරිදි නිර්දේශයන් ඉදිරිපත් කිරීම. නව නිපැයුමෙහි වැදගත්කම සහ අලෙවිය පිළිබඳව කොමිසම විසින් දෙනු ලබන තීරණය මත රඳා පවතිමින් ණය මුදලේ ප්‍රමාණය නිර්ණය කරනු ලැබේ.

(ඉ) දේශීය නව නිපැයුම් ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි අලෙවි කිරීම සඳහා නව නිපැයුම්කරුවන්ට උපකාර කිරීම.

(ඊ) කෘෂිකර්මය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය, භෞතික විද්‍යාව, මහජන ආරක්ෂා, සුභ සාධනය හා ජාතික ආරක්ෂාව, පොදු කර්මාන්ත හා යටිතල පහසුකම්, ප්‍රවාහනය යන ක්ෂේත්‍ර වල සහ වෙනත් එවැනි විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍ර වල එක් එක් වර්ෂයන්හි ශ්‍රී ලංකාවේ දී පේටන්ට් බලපත්‍ර දෙන ලද සියළු ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් සඳහා වාර්ෂිකව ජනාධිපති සම්මාන පිරිනැමීම හරහා දේශීය නව නිපැයුම් ප්‍රකට කිරීම වෙනුවෙන් ඔවුන් ඇගයීම හා ධෛර්ය දීම.

(උ) බලය දෙන ලද නව නිපැයුම්කරුවනට සහ පර්යේෂකයන්ට ස්වකීය අනුමත කළ නව නිපැයුම් සහ පර්යේෂණ කරගෙන යාම සඳහා හෝ ඒවා පරිපූර්ණ කිරීම සඳහා පර්යේෂණ රසායනාගාර හෝ අත්හදා බැලීමේ මධ්‍යස්ථාන පහසුකම් හා සේවා ලබා ගත හැකි වන පරිදි පොදු පර්යේෂණ රසායනාගාරයක් සහ අත්හදා බැලීම් මධ්‍යස්ථානයක් පිහිටුවීම හා පවත්වාගෙන යාම.

(ඌ) “නව නිපැයුම් පිළිබඳ ජනාධිපති ප්‍රදාන” තරඟවල ඒ ඒ විනිශ්චයකරුවන් විසින් තෝරාගනු ලබන ජයග්‍රාහකයන්ට මුදල් ත්‍යාග හා පදක්කම් පිරිනැමෙන “නිර්මාණාත්මක පර්යේෂණ තරඟයක්” වාර්ෂිකව පැවැත්වීමෙන් ශ්‍රී ලංකාවේ ජනතාව අතර නව නිපැයුම් කිරීම, නිර්මාණශීලීත්වය වැඩි දියුණු කිරීම, ඊට ධෛර්ය දීම සහ කෘෂිකර්මය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව ආදී වූ විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍රවල නව නිපැයුම් නිර්මිත කිරීමට ඔවුන්ට සහාය දීම.


(එ) නව නිපැයුම් සහ පර්යේෂණ පිළිබඳවත් පොදුවේ විද්‍යාව පිළිබඳවත් තොරතුරු පළකිරීම සහ පතල කර හැරීම.

(ඒ) නව නිපැයුම්කරුවන් අතර අදහස් හුවමාරු කරගැනීම සඳහා මාසික රැස්වීම් නිතිපතා පැවැත්වීම.

(ඔ) නව නිපැයුම් සහ පර්යේෂණ සඳහා පැවැත්වෙන අන්තර්ජාතික තරඟවලට සහභාගීවීමට ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට උපකාරීවීම හෝ එවැනි තරඟවලට ඔවුන් නිර්දේශ කිරීම.

(ඕ) ශ්‍රී ලාංකික යෞවනයන් අතර නිර්මාණශීලීත්වය වැඩිදියුණු කිරීම සහ ඊට ධෛර්යදීම සඳහා පාසල්වල, විශ්වවිද්‍යාල වල නිර්මාණාත්මක සමිති සංවිධානය කිරීම.

## 1.6 ආයතනික සැලැස්ම



### 1.7 මානව සම්පත

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | 2023 වර්ෂයේ කාර්ය මණ්ඩලය | 2023 දෙසැම්බර් 31 දින පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරි) | 01 | 01 | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | 02 | 02 | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | 01 | 01 | - |
| නීති නිලධාරි | 01 | - | 01 |
| වැඩසටහන් නිලධාරි | 03 | 03 | - |
| පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| මූල්‍ය නිලධාරි | 01 | 01 | - |
| පර්යේෂණ සහකාර | 05 | 02 | 03 |
| කළමනාකරණ සහකාර | 07 | 04 | 03 |
| රියදුරු | 04 | 04 | - |
| කාර්යාල සහායක | 02 | 02 | - |

## 1.8 කොමිසමේ පාලක මණ්ඩලය හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්



**එස්. කේ. සිරිල් සුදුවැල්ල මයා**
කොමසාරිස්



**කල්පනී රාජපක්ෂ මිය**
සහකාර කොමසාරිස්



**ඉංජිනේරු ආනන්ද නාමල් මහතා**
සහකාර කොමසාරිස්



**එම්. කේ. ඩී. එන්. මාදම්පේ මිය**
භාණ්ඩාගාර නියෝජිත



**ඉංජිනේරු එන්. එන්. ඩබ්. දොලවත්ත මයා**
අධ්‍යක්ෂ(ප්‍ර. වි. නි)



**ඩී. ඒ. සරත්චන්ද්‍ර**
සහකාර අධ්‍යක්ෂ (මුදල්)



**ඩී. එම්. එල්. රත්නායක මයා**
සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති)



**පී. එල්. ලියනගම මිය**
සහකාර අධ්‍යක්ෂ (විශේෂ ව්‍යාපෘති)

## 2. 2023 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘති සහ වැඩසටහන්

### 2.1 ජාත්‍යන්තරය හා ශ්‍රී ලංකාව නවෝත්පාදනයන් යා කරන, "සහසක් නිමැවුම් 2023" අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සහ තරඟාවලිය

"සහසක් නිමැවුම්" අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය හා තරඟාවලිය නව නිපැයුම්කරුවන්ට සුවිශේෂී ප්‍රතිලාභ අත්කර දෙන්නා වූ වැඩසටහනකි. මෙය සංවිධානය කරන ලද්දේ නව නිපැයුම් නිවැරදිව සමාජගත කිරීම, ආයෝජක ප්‍රජාව හා සම්බන්ධ වෙමින් නිපැයුම් වාණිජකරණ මට්ටම දක්වා රැගෙන යාම, දැනුම හා තාක්ෂණය සෙසු නිර්මාණකරුවන් සමඟ හුවමාරු කරගැනීම, ජයග්‍රහණ සඳහා නිසි ඇගයීමක් ලබාගැනීම මෙන්ම අන්තර්ජාතික මට්ටමේ ප්‍රදර්ශනයකට ඉදිරිපත් වීමේ අවස්ථාව හිමි කර ගැනීම යනා දී වූ විවිධ ප්‍රතිලාභ නව නිපැයුම්කරුවන් වෙත ලබාදීමේ අරමුණ ඇතිව ය.

මෙම තරඟයේදී දේශීය තරඟ අංශය නියෝජනය කරමින් පාසල්, විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතන, වාණිජකරණය වූ නව නිපැයුම් මෙන්ම විවෘත යන ප්‍රධාන අංශ හතරක් යටතේ පහත දක්වා ඇති තාක්ෂණික ක්ෂේත්‍ර දාහතර (14) ට අදාල වන පරිදි තරඟය සඳහා ඉදිරිපත් වීමට ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ට අවස්ථාව සැලසේ.

- මහජන ආරක්ෂාව, සුභසාධනය හා ජාතික ආරක්ෂාව
- රසායන විද්‍යාව
- ආහාර තාක්ෂණය
- වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය
- සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව
- පොදු කර්මාන්ත හා යටිතල පහසුකම්
- භෞතික විද්‍යාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- කෘෂිකර්මය
- ව්‍යවහාරික විද්‍යා හා තාක්ෂණ
- බලශක්තිය
- පරිසර සංරක්ෂණය
- ප්‍රවාහනය
- ඉංජිනේරු


2019 වසර දක්වා පළාත් මට්ටමේ දැනුවත් කිරීම් ඔස්සේ දීපව්‍යාප්ත මට්ටමින් සංවිධානය කළ සහසක් නිමැවුම් තරඟාවලිය ඉන් අනතුරුව මාර්ගගත වැඩසටහනක් (online competition) ලෙස ක්‍රියාත්මක කිරීම ඇරඹුනි. 2023 වසරේ දී ද එම ක්‍රමවේදය අනුගමනය කරමින් සාර්ථක තරඟාවලියක් පැවැත්වීමට කොමිසම කටයුතු කරන ලදි.

ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය පාදක කර ගනිමින් කොමිසම විසින් "සහසක් නිමවුම් 2022"සම්මාන ප්‍රධානෝත්සවය, 2023 ඔක්තෝම්බර් 26 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී ගරු අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ රාජ්‍ය අමාත්‍ය ආචාර්ය සුරේන් රාඝවන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිහාල් රණසිංහ සහ කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තිලකා ජයසුන්දර මැතිණියගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි. රාජ්‍ය වියදම් කළමණාකරණය සඳහා කොමිසම විසින් වර්ෂ 2022 දී පවත්වන ලද වැඩසටහන් රාශියකදි ජයග්‍රහණය කරන ලද ජයග්‍රාහකයින් ඇගයීම් සඳහා මෙම අවස්ථාව උපයෝගි කර ගන්නා ලදී.



### 2.1.1 "සහසක් නිමැවුම් 2023" හි ප්‍රගතිය

සහසක් නිමැවුම් 2023 ජාතික තරඟයට සමගාමීව මාර්ගගත ක්‍රමය ඔස්සේ zoom තාක්ෂණය භාවිත කරමින් නව නිපැයුම් කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිංහල සහ ඉංග්‍රීසි යන මාධ්‍ය දෙකෙන්ම පවත්වන ලදී. එහිදී පාසල්, විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන, වාණිජකරණ සහ විවෘත යන අංශයන්ට අදාළ නව නිපැයුම්කරුවන් සහ පාසල් නව නිපැයුම් භාර ආචාර්යවරුන් ඒ සඳහා සහභාගී විය.







මෙවර සහසක් නිමැවුම් 2023 තරඟය සඳහා නව නිපැයුම් 737 ක් අයදුම් කර තිබිණි.මෙහිදී ඊට සමගාමීව රුහුණු නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රදර්ශනය 2023 (RIIE-2023), රුහුණු විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධව දකුණු පළාත සඳහා පළාත් නව නිපැයුම් ඇගයීම් කටයුතු පවත්වන ලද අතර දිවයිනේ අනෙකුත් පළාත් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ පළාත් ඇගයීම් කටයුතු පවත්වන ලදී.

එහිදී ජාතික මට්ටමේ ඇගයීම් කටයුතු සඳහා නවනිපැයුම් 560ක් සුදුසුකම් ලබන ලදී. මේ වනවිට එහි ජාතික මට්ටමේ ඇගයීම් කටයුතු අවසාන අදියරෙහි පවතින අතර මේ සඳහා ආයතනය සතු ජාතික විනිශ්චය මඩුල්ලෙන් 150 ට අසන්න විනිශ්චය කමිටු සාමාජිකයින් ප්‍රමාණයක් ඇගයීම් කටයුතු සඳහා දායක වී ඇත.

**2.1.2 සහසක් නිමැවුම් අන්තර්ජාතික තරඟාවලිය**




2019 වසර දක්වා රාජ්‍ය භාණ්ඩාගාරය මත පමණක්ම යැපෙමින් සිය කාර්යභාරයට අවතීර්ණ වී සිටි ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 2019 වසරේ සිට ආදායම් උපයන මාර්ගයට පිවිස සිටී. ඒ අනුව, "සහසක් නිමැවුම්" කේන්ද්‍ර කර ගනිමින් 2019 වසරේ සිට විදෙස් නව නිපැයුම් ලියාපදිංචිය මඟින් ආදායම් ඉපැයීමට කොමිසමට හැකියාව ලැබී ඇත. ඒ අනුව, නව නිපැයුම් වාණිජකරණය තුලින් දේශීය ආදායමට ශක්තියක් ගෙන දෙනවාට අමතරව ආදායම් උපයමින් රාජ්‍ය භාණ්ඩාගාරයට අත්වැලක් සැපයීමට ද කොමිසමට හැකියාව ලැබී තිබේ.

| වර්ෂය | උපයන ලද මුදල | |
|---|---|---|
| 2023-2024 | විදේශීයව ලද | 2023-2024 සහසක් නිමැවුම් අන්තර්ජාතික තරඟය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 2023 | දේශීයව ලද | LKR 243,375 |

මේ වනවිට සහසක් නිමැවුම් අන්තර්ජාතික තරඟය 2023-2024 යන වර්ෂයන් සඳහා ඒකාබද්ධ තරඟයක් ලෙස පැවැත්වීමට කටයුතු යොදා ඇත.




## 2.2 නව නිපැයුම් වාණිජකරණය සඳහා වන මූල්‍ය සහන වැඩසටහන්

ශ්‍රී ලංකාවේ නවෝත්පාදන කඩිනම් කිරීමේ මූල්‍ය යාන්ත්‍රණය සහ නව නිපැයුම් දිරිය යන වැඩසටහන් හරහා මූල්‍ය සහන යටතේ ලබා දෙමින් තිබූ පොළී රහිත ණය ලබා දීම 2022 වර්ෂයේදී නවතා දැමීමත් සමග නව නිපැයුම්කරුවන්ගේ මූල්‍ය අවශ්‍යතා සඳහා රාජ්‍ය බැංකු වෙත යොමු කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් ලැබුණු යහපත් ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් පසු ගිය වසර අග භාගයේ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව නව නිපැයුම්කරුවන් 11 දෙනෙකු කොමිසම මගින් නිර්දේශ කොට යොමු කරන ලදී.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ සඳහන් පරිදි කොමිසම මඟින් හඳුනාගත් ශ්‍රී ලංකාවට වැඩදායී නව නිපැයුම් වාණිජකරණය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාගැනීමට ණය දෙන ආයතන හා සම්බන්ධීකරණය කිරීම සහතික කරමින්, එම නව නිපැයුම්කරුවන්ට අපේක්ෂිත ණය ලබා දීමේ ශක්‍යතාවය ඇගයීම සඳහා ප්‍රදේශීය සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම ක්ෂේත්‍ර පරීක්ෂණ 11 ක් සිදු කරන ලදී.

ඒ අනුව ඒ. කේ. සමන්ත නව නිපැයුම්කරුට රු. ලක්‍ෂ හයක මුදලක් 23% පොළී අනුපාතිකයක් යටතේ ලබා දීමට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව කටයුතු කරන ලදී. මෙම නව ප්‍රවේශය තුල ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන් හට සිය පේටන්ට් බලපත්‍ර පමණක් ඇපය වශයෙන් තබමින් එම නව නිපැයුම් වාණිජකරණය සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාදීමට කටයුතු සම්පාදනය කෙරුණද වසරක් අවසානයේ එම උත්සාහය සාර්ථකත්වයට පැමිනෙණු දක්නට නොලැබිණි. ඒ සඳහා බලපාන ලද කොමිසම මගින් නිරීක්ෂණය කළ ප්‍රධාන හේතූන් වූයේ තරඟකාරී පොළී අනුපාතිකයක් ලබා දීමට එම බැංකුව අපොහොසත් වීම සහ පේටන්ට් බලපත්‍රය පමණක් ඇපයට තබා ගැනීම පසෙකලා සාමාන්‍ය බැංකු ක්‍රමවේදය අනුව යමින් ඇප ලබා ගැනීම අවශ්‍ය වීම ද වේ.



## 2.3 නව නිපැයුම්කරුවන්ට තාක්ෂණික සහයෝගය ලබාදීම වෙනුවෙන් ස්ථාපිත තාක්ෂණික බීජෞෂණ මධ්‍යස්ථාන (Technology Incubation Centers)

1979 අංක 53 දරණ නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත ප්‍රකාරව කොමිසම තුලම පර්යේෂණාගාරයක් පවත්වාගෙන යාම සඳහා කටයුතු සම්පාදන කිරීමට අවශ්‍යව තිබුණද ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසාගැනීමේ අපහසුතාවයන් හේතුවෙන් විකල්ප ක්‍රමවේදයන් හරහා එම අවකාශ සපුරාලීමට කොමිසම කටයුතු යොදා ඇත. තාක්ෂණික බීජෞෂණාගාර ස්ථාපිත කිරීම එහි එක් පියවරකි. ඒ හරහා ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට වඩාත් පහසු ආකාරයෙන් නව නිපැයුම් වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික සහයෝගය ලබා දීමට පියවර ගෙන ඇත.



ඒ අනුව කොමිසමේ පූර්ණ මැදිහත්වීම මත තාක්ෂණික බීජෞෂණ මධ්‍යස්ථාන හතරක් ජා-ඇල ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙහි, යාපනය විශ්වවිද්‍යාලයෙහි, රජරට විශ්වවිද්‍යාලයෙහි හා රුහුණ විශ්වවිද්‍යාලයෙහි ස්ථාපිත කරන ලදී.

එමඟින් ශ්‍රී ලාංකිය නව නිපැයුම්කරුවන්ට, විශ්වවිද්‍යාල සිසුන්ට හා පාසල් නව නිපැයුම්කරුවන්ට තම සංකල්පමය අදහස් හා ප්‍රාථමික නව නිර්මාණ, වෙළෙඳපොල ජයගතහැකි නිපැයුම් දක්වා වැඩිදියුණු කිරීමට අවශ්‍ය තාක්ෂණික විශේෂඥයින්ගේ සහාය මෙන්ම බීජෞෂණ මධ්‍යස්ථානයේ පහසුකම් ද ලබාගත හැක.

## 2.4 ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සහ BCS the Chartered Institute for IT Sri Lanka Section සහයෝගීතාවය

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය පදනම් කරගනිමින් තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ නව නිපැයුම් දිරිගැන්වීම සඳහා BCS (British Computer Society) the Chartered Institute for IT Sri Lanka Section සමග 2023 වසරෙදීත් නවෝත්පාදන වැඩසටහන පැවැත්වීමට කොමිසමේ සහයෝගය ලබා දෙන ලදී. මෙහි මූලික පරමාර්ථය වුයේ නවීනතම තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිෂ්පාදන සහ නවෝත්පාදන හඳුනා ගැනීමයි. මෙහිදී අධ්‍යක්ෂ (ප්‍ර.වි.නි.) ඉංජිනේරු එන්. එන්. ඩබ්. දොලවත්ත මයා ජාතික ආපදා වලක්වා ගැනීමට අදාල නව නිපැයුම් විනිශ්චය කිරීම සඳහා දායක විය.



මෙහිදී ජයග්‍රාහයකයින්ව සහ විනිශ්චය මණ්ඩලය ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මාන උළෙලේදී සම්මානලාභීන් ලෙස ඇගයීමට ලක් කෙරුණු අතර මෙමගින් ජයග්‍රාහකයින්ට

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්බන්ධ අන්තර්ජාතික තරඟ සඳහා සහභාගී වීමට මංපෙත් විවර විය. ඉදිරියටද මෙම හවුල්කාරීත්වය පදනම් කර ගනිමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ නවෝත්පාදන වල දියුණුව උදෙසා ක්‍රියාකරනු ලැබේ.

## 2.5 කෘෂිකර්මයට අදාළ නව නිපැයුම් ඇගයීම සහ ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

කෘෂිකර්ම අමාත්‍යාංශය සමග එක්ව වාර්ෂිකව සංවිධානය කරන කෘෂි නවෝත්පාදන ප්‍රවර්ධන වැඩසටහන 2023 වසරේදීද ක්‍රියාත්මක විය. ඒ සඳහා කෘෂිකර්මාන්තය ආශ්‍රිත නවනිපැයුම් සිදුකල "සහසක් නිමැවුම්" ජයග්‍රාහී නවනිපැයුම්කරුවන් 30 දෙනෙකුට එම වැඩසටහන සමඟ සම්බන්ධවීමට අවස්ථාව සලවන ලදී.

එම නිර්මාණකරුවන්ගේ නවනිර්මාණ සඳහා බුද්ධිමය දේපල අයිතිය ආරක්ෂා කරගැනීම සඳහා ද කොමිසම විසින් පේටන්ට් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ද පවත්වනු ලැබිණ.

ඊට අමතරව දකුණු පළාත් කෘෂි ව්‍යවසාය සංවර්ධන හා පුහුණු ඒකකය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ දකුණු පළාත් කෘෂි ව්‍යවසායකයින් සඳහා වූ වැඩසටහන සඳහා ද කොමිසම සහයෝගය දක්වන ලදී. එම වැඩසටහන සඳහා කෘෂිකර්මය සම්බන්ධ නව නිර්මාණ සිදු කල දකුණු පළාත් නවනිපැයුම්කරුවන් ද කොමිසම මඟින් සම්බන්ධ කර දුන් අතර ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 3ක් ද, දෙවන අදියර වශයෙන් පුහුණු වැඩසටහන් 3ක් ද කොමිසම මඟින් පවත්වනු ලැබිණ.

## 2.6 රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය

කොමිසම විසින් දේශීය නව නිපැයුම් හා නවෝත්පාදන දිරිමත් කිරීම වෙනුවෙන් කටයුතු කරන අතර ඒ හා උනන්දුව දක්වන, එමඟින් තම ආයතනික කටයුතු නවමු ක්‍රමවේදයන් ඔස්සේ ක්‍රියාත්මක කිරීමට කැමැත්තක් දක්වන පෞද්ගලික ආයතන කිහිපයක් සමගම 2023 වසරේ දී විවිධ මට්ටමේ හවුල්කාරීත්වයන් ගෙන් යුතු වැඩසටහන් පවත්වනු ලැබිණ. විවිධ නව නිපැයුම් හා නවෝත්පාදන තරඟාවලි සංවිධානය, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම්, නව නිපැයුම් වාණිජකරණ අවස්ථා ලබාදීම් මෙන්ම නව නිර්මාණකරුවන් වෙනුවෙන් අනුග්‍රාහකත්ව ලබාදීම් සඳහා ද පහත දැක්වෙන පෞද්ගලික ආයතන කොමිසම සමඟ ඒකාබද්ධව වැඩ කටයුතු සිදු කරන ලදී.

- SPAR Sri Lanka
- Panacea (Pvt) Ltd
- Dialog Axiata PLC
- ADVANTIS Engineering
- Arpico Furniture
- Brandix Apparel (Pvt) Ltd
- D Samson Industries (Pvt) Ltd
- Gaja TV
- Shardha Media Network

## 2.7 නව නිපැයුම්කරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වැඩමුළු

නව නිපැයුම්කරණය සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීමේ දී විවිධ පාර්ශව හා ආයතන වෙතින් ලැබෙන ඉල්ලීම් සඳහා ද විශේෂ ස්ථානයක් හිමි වේ. මෙම වැඩමුළු හරහා නව නිපැයුම්කරණය පිළිබඳව දැනුවත් වීමට මෙන්ම ප්‍රායෝගික අත්දැකීම් ලබාගැනීමට ද එම වැඩසටහන් සඳහා සහභාගීවන්නන් හට අවස්ථාව සැලසේ.

2023 වර්ෂය සඳහා නවනිපැයුම් හා නවෝත්පාදනයන් පිළිබඳව පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන් 8ක් ද, ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් 4ක් ද කොමිසම විසින් පවත්වනු ලැබ ඇත.

දකුණු පළාත් කෘෂි ව්‍යවසාය හා සංවර්ධන ඒකකය Advantis Engineering පුද්ගලික ආයතනය සහ පාසල් 08 මෙන්ම ශ්‍රී ලංකා යුධ හමුදාව සහ කැස්බෑව විදාතා මධ්‍යස්ථානය මඟින් කරන ලද ඉල්ලීම් අනුව දැනුවත් කිරීමේ වැඩසටහන් 09ක් මෙන්ම නව නිපැයුම්කරණය පිළිබඳව වැඩමුළු 03ක් ද පවත්වනු ලැබිණ. එම වැඩසටහන් මඟින් 1000කට ආසන්න පිරිසකට ප්‍රතිලාභ හිමිවිය.

## 2.8 ශ්‍රී ලාංකේය නවෝත්පාදන සංස්කෘතියක ඉදිරි ගමන උදෙසා යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීම

පාසල් සිසුන් හා විශ්වවිද්‍යාල මෙන්ම තෘතියික අධ්‍යාපන ආයතනයන් හි සිසුන් අතර නවෝත්පාදන සංස්කෘතියක් නිර්මාණය කිරීම වෙනුවෙන් නව නිපැයුම් සමාජ ස්ථාපිත කිරීමේ වැඩසටහන ක්‍රියාවට නංවනු ලබයි. 2023 වසරේ දී අයදුම්පත් ලැබුනු පාසල් නව නිපැයුම් සමාජ 105 ක නව නිපැයුම් සමාජ ස්ථාපනය කල අතර නැගෙනහිර විශ්වවිද්‍යාලයෙහි ස්වාමි විපුලානන්ද සෞන්දර්යය අධ්‍යයන ආයතනයෙහි නව නිපැයුම් සමාජයක් ස්ථාපනය කිරීමද සිදුවිය.

පාසල් නව නිපැයුම් සමාජ සඳහා ලබාදුන් මූල්‍යාධාර සඳහා වන ප්‍රගතීන් පාසල් 31කින් 2023 වර්ෂයෙහි ලැබුණු අතර එහි අවශ්‍ය උපකරණ මිලදී ගැනීම හා පාසල් නව නිපැයුම් ප්‍රවර්ධන කටයුතු සඳහා ප්‍රදර්ශන සංවිධානය දේශන වැනි දෑ අඩංගු වේ.

ඒ අතර පහත පාසල් වල නව නිපැයුම් තරඟ සඳහා කොමිසමේ සහාය ලබා දෙනු ලැබීය

1. විශාකා විද්‍යාලය -Innosphere’23
2. නාලන්ද විද්‍යාලය -NOVUS TECHNICA ‘23
3. නුගේගොඩ ශාන්ත ජෝන්ස් විද්‍යාලය
4. මහානාම විද්‍යාලය -INSYPO’ 23







එමෙන්ම පහත පාසල් තුල නව නිපැයුම් දැනුවත් කිරීම් වැඩසටහන් සිදුකෙරිණ.

1. මහාමාත්‍ය විද්‍යාලය, අතුරුගිරිය
2. ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, වෙන්නප්පුව
3. හේමමාලි මහා විද්‍යාලය (ගණේමුල්ල)
4. වලල ඒ රත්නායක මධ්‍ය මහා විද්‍යාලය,මහනුවර
5. ශාන්ත ජෝන් විද්‍යාලය, නුගේගොඩ
6. ඩඩ්ලි සේනානායක මහා විද්‍යාලය
7. ආනන්ද මහා විද්‍යාලය, දෙවලපොල
8. චන්ද්‍රවංශ මහා විද්‍යාලය, ඇලපිටිවෙල




අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ පාසල් නව නිපැයුම්කරුවන්ට හා ගුරුවරුන්ට නව නිර්මාණකරණය හා නවෝත්පාදනය පිළිබඳ අත් පොතක් 2023 වර්ශයේ නිර්මාණය කරන ලද අතර පාසල් නව නිපැයුම් සමාජ වල සමාජකයින්ට මෙය බෙදාදීමට  අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව කටයුතු කරමින් පවතී .මෙමඟින් නව නිපැයුම් සමාජ සක්‍රීයව පවත්වා ගැනීමටත්, නව නිපැයුම් සමාජවල ප්‍රගතිය ලබා ගැනීමටත් උපකාර වනු ඇත.

එසේම Brandix ආයතනය හා එක්ව මිනුවන්ගොඩ ආනන්ද මහා විද්‍යාලයේ පාසල් නව නිපැයුම් සමාජය සඳහා Smart Board  එකක් ලබාදීම තුලින් පාසලේ තාක්ෂණික පහසුකම්  වැඩිදියුණු කිරීමක් මෙන්ම නව නිපැයුම් සමාජයේ ඉදිරි ගමන උදෙසා දායකත්වයක් සැපයිණි.







## 2.9 යොවුන් නව නිපැයුම් දිරිගන්වන "Sri Lanka Inventors Commission" YouTube වැනලය සහ Facebook පිටුව

Youtube සහ සමාජ මාධ්‍ය (Social Media) වැනි නව ප්‍රවණතා යොදා ගනිමින් මෙම වේදිකාව හරහා නව නිපැයුම්කරුවන්ගේ නව නිර්මාණ මෙන්ම විවිධ ක්ෂේත්‍රයන් හි දැනුම බෙදා හදා ගැනීමට කටයුතු සලස්වා ඇත.

වාණිජකරණය සඳහා යෝග්‍ය දේශීය නව නිපැයුම් විධිමත්ව ලෝකයට විවෘත කිරීම හරහා නව නිපැයුම්කරුවන්ට අභිමානය ලඟා කර දීමත්, දෙස් - විදෙස් ආයෝජකයන් වෙතින් එම නිපැයුම් වාණිජකරණයට සහාය ලබාගැනීමත් අරමුණු කරගනිමින් නවීන තාක්ෂණය ආශ්‍රයෙන් ලෝකය සමඟ ඉදිරියට ගමන් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර දීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ නව වැඩසටහනකි. එමෙන්ම නවක නිපැයුම්කරුවන්ට නවෝත්පාදනය පිළිබඳව දැනුවත්භාවයක් ලබාගැනීමටත්, පේටන්ට් බලපත්‍රය සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය ඇතුළු බොහොමයක් තොරතුරු පිළිබඳව නිසි අවබෝධයක් කඩිනමින් සහ ඕනෑම අවස්ථාවක ලබාගැනීමටත් මෙම වැනලය හරහා අවකාශ සලසා දී තිබේ.

මෙමඟින් නවෝත්පාදන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, සම්පත් දායකයින්ගේ මඟ පෙන්වීම ලබා දීම සහ නව නිපැයුම් පිළිබඳ දැනුවත් කිරීම, නව තාක්ෂණික දැනුම ලබාදීම සහ පාසල් සිසුන් අතර දැනුම පරතරය අවම කිරීම වැනි තවත් විශේෂ ප්‍රතිලාභ රැසක් ලබා ගත හැකිය.

2023 වර්ෂය තුල වීඩියෝ 4ක් පලකරන ලද අතර නැරඹීම් 19,872 සහ වැනලය සඳහා එක්වීම් (Subscribers) 226 ඇත.




## 2.10 දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ අයිතීන් සුරැකීමට නව නිපැයුම්කරුවන්ට සහාය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව ගුරුවරුන් 800 පිරිසක් නව නිපැයුම් ප්‍රවර්ධනය සහ බුද්ධිමය දේපල අයිතිය තහවුරු කර ගැනීම සම්බන්ධව පුහුණු කිරීමට සැලසුම් කරන ලදි. පාසැල් නව නිපැයුම් වල බුද්ධිමය දේපල අයිතිය සුරැකීම සඳහා මෙය අතිශයින් වැදගත් වේ.

ඒ අනුව පලමු පියවර ලෙස බස්නාහිර පළාත් නව නිපැයුම් සඳහා උනන්දුවක් දක්වන ගුරුවරුන් 40 පමණ සඳහා ගුරු පුහුණු වැඩසටහනක් අධ්‍යාපන අමාත්‍යංශය, ජාතික බුද්ධිමය දේපල කාර්යාලය හා නව නිපැයුම් කොමිසම එක්ව ජාතික අධ්‍යාපන ආයතනයෙදී පැවැත්විණි.



### 2.10.1 බුද්ධිමය දේපල ලබාදීමට පහසුකම් සැලසීම

කොමිසම විසින් පේටන්ට් වැඩමුළු 05ක් පවත්වන ලද අතර මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වෙමින් පේටන්ට් වැඩමුළු 02ක්ද දකුණු පළාත් කෘෂි ව්‍යවසාය හා සංවර්ධන ඒකකය සමග එක්ව ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි කෘෂි නවෝත්පාදකයින් සඳහා පේටන්ට් වැඩමුළු 03ක්ද කොමිසම මගින් පවත්වන ලදි.

ඒ අනුව සහසක් නිමැවුම් 2021 සහ 2022 ජයග්‍රාහකයින් 76 ක් සඳහා තම නිර්මාණ වෙනුවෙන් පේටන්ට් අයදුම් කිරීමට අවශ්‍ය අයදුම්පත් හා මාර්ගෝපදේශ සපයනු ලැබූ අතර පේටන්ට් පිළිබඳ මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් පවත්වමින් එම නිර්මාණකරුවන් සඳහා පේටන්ට් පිළිබඳ අවශ්‍ය මූලික දැනුමින් එම නිර්මාණකරුවන් සන්නද්ධ කරවීමට කොමිසම කටයුතු කරන ලදි.

ඊට අමතරව පේටන්ට් සම්බන්ධ දැනුවත්කිරීමේ වැඩසටහන් මගින් මෙන්ම ඒ පිළිබඳ තොරතුරු අවශ්‍ය නිර්මාණකරුවන් සඳහාද කොමිසම මගින් පේටන්ට් පිළිබඳ දැනුවත් කරමින් අවශ්‍ය සහයෝගයන් නිරන්තරයෙන් ලබාදෙන ලදි.

### 2.11 ජාත්‍යන්තර රටවල පේටන්ට් අයදුම් කිරීම සඳහා සහාය ලබාගැනීමේ ක්‍රමවේදය

දේශීය නව නිර්මාණකරුවන් තම නව නිර්මාණ සඳහා ජාත්‍යන්තර රටවල පේටන්ට් බලපත්‍ර අයදුම් කරනු ලබන අවස්ථාවලදී හෝ පේටන්ට් සහයෝගීතා ගිවිසුම යටතේ තම බුද්ධිමය දේපළ අයිතිය තහවුරු කරගැනීමට කටයුතු කරනු ලබන අවස්ථා වලදී, ඒ සම්බන්ධයෙන් ඔවුනට වැයවන මුදල් ප්‍රතිපූරණය කරගැනීමට මෙන්ම එම කටයුතු වෙනුවෙන් කරනු ලබන වෘත්තීය ගෙවීම් වෙනුවෙන් මුදලින් රු 100,000 දක්වා ප්‍රතිපූරණය කර ගැනීමට කොමිසම ප්‍රතිපත්තිමය තීරණයක් වශයෙන් අවස්ථාව සලසා දී ඇත.

එහිදී එම නව නිර්මාණය සඳහා ජාත්‍යන්තර වශයෙන් පේටන්ට් හෝ පේටන්ට් සහයෝගීතා ගිවිසුම ලබා ගැනීම වෙනුවෙන් කොමිසම මගින් වැයකරන්නට යෙදෙන මුදල වියදමක් ලෙස සැලකීම වෙනුවට විදේශ විනිමය වශයෙන් නැවත මෙරටට ලබාගත හැකිවන ආයෝජනයන් ලෙස සලකා කොමිසම කටයුතු කරන අතර, රාජ්‍ය මුදල් යෝග්‍ය ලෙස භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රියාවට නංවා ඇත.

### 2.12 නව නිපැයුම්කරුවන් ආයෝජකයින් හා සම්බන්ධ කරවීම

පේටන්ට් බලපත්‍රලාභී නව නිර්මාණකරුවන් හතර දෙනෙකුගේ නව නිර්මාණ රාජ්‍ය හා පෞද්ගලික ව්‍යාපාර ආයතන සමග සම්බන්ධ කරමින් ඔවුන්ගේ නව නිර්මාණ වාණිජකරණය කිරීමට කොමිසම කටයුතු කරනු ලැබිණ. “Lightning Earthing Device” නව නිපැයුම ශ්‍රී ලංකා දුම්රිය සේවය සමග සම්බන්ධ කරවමින් වටිනා වාණිජකරණ අවස්ථාවන් ලබාදීමට කොමිසම කටයුතු කරන ලදි.

Mechanical exfoliation technique for scalable production of nanoflakes from layered materials නව නිපැයුම කහටගහ ග්‍රැෆයිඩ් ලංකා සමාගම සහ බෝගල ග්‍රැෆයිඩ් ලංකා ආයතන සමඟ සම්බන්ධ කරවමින්

ඉදිරි වාණිජකරණ කටයුතු සඳහා පර්යේෂණ සහයෝගය නොමිලේම ලබා ගැනීමට කටයුතු සලස්වා දෙන ලදි. පර්යේෂණ කටයතු වෙනුවෙන් අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීමේ සහයෝගය නොමිලේම ලබා ගැනීමට කටයුතු සලස්වා දෙන ලදි.

## 2.13 අනාගතය සඳහා වන ඒකාබද්ධ ව්‍යාපෘති

### 2.13.1 තරුණ නව නිපැයුම්කරු - ව්‍යවසායක නායකත්ව සංවර්ධන වැඩසටහන (Young Inventor – Entrepreneur Lead Development - YIELD)

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම පැනසියා පුද්ගලික සමාගම හා ඒකාබද්ධව දැයේ පාසල් තුල නව නිපැයුම් කුසලතාවයන් ඔප් නැංවීමේ අරමුණින් ලෝකයෙහි පවතින නවීන තාක්ෂණයක් වන පරිගණක මෘදුකාංග භාවිතා කරමින් නව නිපැයුම් නිර්මාණය, ක්‍රියාකාරීත්වය පරික්ෂා කිරීම හා 3D මුද්‍රණ යන්ත්‍ර භාවිතයෙන් (ලෝක ප්‍රසිද්ධ ජර්මානු සිමෙන්ස් ආයතනයේ “Solid Edge”) එය සැබෑ නිර්මාණයක් බවට පත්කිරීම සඳහා පාසල් තරුණ නව නිපැයුම්කරු - ව්‍යවසායක නායකත්වය සංවර්ධන වැඩසටහන හා නව නිපැයුම් තරඟ පැවැත්වීම කටයුතු කර ඇත.

PANACEA SOLUTIONS (PVT) LTD ආයතනය හා එක්ව සිදු කරන මෙම වැඩසටහන හරහා නොමිලේ ලබාදෙනු ලබන පරිගණක මෘදුකාංගය මඟින් මූලද්‍රව්‍ය සඳහා වන වියදම අවමවීමත්, නිෂ්පාදනය කිරීම සඳහා වන ශිල්පී දැනුම මෙන්ම යන්ත්‍රසූත්‍ර සඳහා වන වියදම අවම වීමත් නව නිපැයුමෙහි ක්‍රියාකාරීත්වය පරිගණක මෘදුකාංග භාවිතා කරමින් පරීක්ෂා කරමින් නැවත නැවත නව නිපැයුමේ වැඩිදියුණු කිරීම් සිදුකිරීමත් මඟින් නව නිපැයුම්කරුගේ මුදල් හා කාලය ඉතුරුකර ගැනීමට හැකිවීම මෙම නවීන තාක්ෂණික ක්‍රමවේදයයේ සුවිශේෂී බවකි. මේ හරහා නව නිර්මාණයක් සිදුකරන ආකාරය පිළිබඳව පාසල් ළමුන් දැනුවත් කිරීම් හා ඒ ආශ්‍රිතව තරඟය 2023 වර්ශයේ සිදුකල අතර ඉදිරියටද මෙම හවුල්කාරීත්වය පදනම් කර ගනිමින් මේ සම්බන්ධ නවෝත්පාදන වල දියුණුව උදෙසා ක්‍රියාකරනු ලැබේ.

තරඟය සඳහා නිර්මාණ අදහස් 700ක් පමණ මූලිකව යොමුව ඇති අතර පරිගණක මෘදුකාංග භාවිතා කරමින් යොමුව තිබූ නව නිපැයුම් නිර්මාණයන් 85ක් අතරින් හොඳම නිර්මාණ 5 ක් තෝරාගැනීමත් PANACEA SOLUTIONS (PVT) LTD ආයතනය මඟින් එම ජයග්‍රාහකයින් දිරිගැන්වීමට 3D මුද්‍රණ යන්ත්‍රයක්, ටැබ් යන්ත්‍ර හා මුදල් ත්‍යාග සහ මේ සඳහා පාසල් තරඟකරුවන් උනන්දු කල ගුරුවරුන් සඳහා SMART දුරකථන ලබා දී ඇගයීමටද ලක්කරන ලදී.






### 2.13.2 මාර්ග අනතුරු සංඛ්‍යාව අවම කර ගැනීම සඳහා නව නිපැයුම් සහ නවෝත්පාදන තරඟය

ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව වාර්තා වන රිය අනතුරු ප්‍රමාණය වැඩිවන ප්‍රවණතාවයක් පෙන්නුම් කරනු ලබන අතර සිදුවන මරණ සංඛ්‍යාව මෙන්ම සිදුවන භෞතික සම්පත් හානි වල ද අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරනු ලැබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතිය භාවිතය තුල දෛනිකව සිදුවන මාර්ග අනතුරු සංඛ්‍යාව අවම කර ගැනීම සඳහා නව නිපැයුම් සහ නවෝත්පාදන උපයෝගී කර ගැනීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම හා මාර්ඟ ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව එක්ව මෙම නව නිපැයුම් ප්‍රවර්ධන වැඩසටහන් 2023 වර්ෂයේ ආරම්භ කල අතර නිර්මාණශීලී ප්‍රවේශයක් තුළින් අඩු පිරිවැයක් භාවිතා කරගනිමින් මාර්ග අනතුරු අවම කර ගැනීම හා කළමණාකරණය කරගැනීම මෙහි අරමුණයි.

### 2.14 දේශීය නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන පිරිනැමීම

ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් ගේ නව නිපැයුම් දිරිගැන්වීම හා ප්‍රවර්ධනය සඳහා ක්‍රියාවට නැංවෙන "දේශීය නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන" පිරිනැමීමේ වැඩසටහන, බුද්ධිමය දේපළ අයිතිය (පේටන්ට්) හිමිකර ගත් නව නිපැයුම් සඳහාම වෙන් වූවකි. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන පේටන්ට් බලපත්‍රලාභී නව නිපැයුම් ලේඛනය පදනම් කරගනිමින් තරඟය පැවැත්වෙන අතර, අතිගරු ජනාධිපතිතුමන් ගේ අනුමැතියෙන් පත් වන විනිශ්චයමණ්ඩලයක් විසින් සමස්ථ ඇගයීම් කටයුතු සිදු කරනු ලබයි. මෙම වර්ෂය තුලදී පේටන්ට් බලපත්‍ර වාණිජකරණය කිරීමට ඇති හැකියාව සම්බන්ධව විශේෂ අවධානයක් දෙන ලදි.

මහජන ආරක්ෂාව සුබසාධනය හා ජාතික ආරක්ෂාව, ආහාර තාක්ෂණය, වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය, පොදු කර්මාන්ත හා යටිතල පහසුකම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ව්‍යවහාරික විද්‍යා හා තාක්ෂණ, පරිසර සංරක්ෂණය, රසායන විද්‍යාව, සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂිකර්මය, බලශක්තිය, ප්‍රවාහන, ඉංජිනේරු යනාදී වූ තාක්ෂණික ක්ෂේත්‍ර දාහතරක් (14) ආවරණය කරමින් නව නිපැයුම් විනිශ්චය කරනු ලබයි.

COVID වසංගතය හා වෙනත් විවිධ බාහිර කරුණු කාරණා හේතුවෙන් 2017 වසරේ සිට 2020 දක්වා වූ පේටන්ට් ලාභී නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන පරිනැමීමේ කාර්යයට බාධා එල්ල වූ අතර, මෙම වර්ෂය තුල දී උක්ත සඳහන් කරන ලද සියළුම තාක්ෂණික ක්ෂේත්‍රයන් ආවරණය කරමින් නව නිපැයුම් විනිශ්චය කටයුතු සම්පූර්ණ කිරීමට හැකියාව ලැබුණි. ඒ අනුව, 2017 වර්ෂයේ 2020 වර්ෂයට අදාලව නව නිපැයුම් විනිශ්චය කටයතු සම්පූර්ණ කරන ලදී. ජයග්‍රහණ හිමි කර ගත් නව නිපැයුම්කරුවන් සඳහා ජනාධිපති සම්මාන පිරිනැමීම වෙනුවෙන් සියළු කටයුතු සංවිධානය කර ඇති අතර, ඒ සඳහා සුදුසු දිනයක් ලබාගැනීම වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශය හරහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

තව ද ජනාධිපති සම්මාන තරඟයට ඉදිරිපත් වූ සියළුම නව නිපැයුම්කරුවන් අරභයා ඔවුන්ගේ නව නිපැයුම් වල වාණිජකරණ විභවය අනුව සලකා, ඊට අවශ්‍ය තාක්ෂණික හා වෙළෙඳපොළ සහාය කොමිසම වෙතින් ලබාදීම වෙනුවෙන් ද පියවර ගැනීමට නියමිත ය.



අවසන් වටයේ නව නිපැයුම් විනිශ්චය

## 2.15 නව නිපැයුම්කරුවන්ගේ හමුව

නව නිර්මාණකරුවන් සහ කොමිසමේ නිලධාරීන් සමඟ නව නිර්මාණකරණය කෙරෙහි ඉදිරි කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම වෙනුවෙන් කොමිසම මගින් වාර්ෂිකව නව නිපැයුම්කරුවන්ගේ හමු 03ක් මෙම වසර තුල කොමිසමේ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. මෙහිදී ඔවුනට සහෝදර නව නිපැයුම්කරුවන් සමඟ අදහස් හුවමාරු කරගැනීමටත්, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන නවතම වැඩසටහන් පිළිබඳව දැනුවත් කිරීමත්, කොමිසම මගින් නව නිපැයුම්කරුවන්ට ලබා දෙන සේවාවන් දනුවත් කිරීමට අවස්ථාව සැලසුන අතර නව නිපැයුම්කරුවන්ගේ ප්‍රයෝගික ගැටලු විසදා ගැනීමට නිපැයුම්කරුවන්ට මෙහිදී අවස්ථාව කොමිසම මගින් සලසා දෙන ලදී.




## 2.16 විද්‍යා දිනය සැමරීම

විද්‍යා දිනය සැමරීම වෙනුවෙන් අමාත්‍යාංශය මඟින් 2023 නොවැම්බර් 8, 9 හා 10 දිනයන්හිදී කොළඹ කෞතුකාගාර පරිශ්‍රයේ සංවිධානය කල ජාතික විද්‍යා ප්‍රදර්ශනය මඟින් පාසල් සිසුන් සහ මහජනතාව අතර නව නිපැයුම් දැනුවත් කිරීම් සහ නව නිපැයුම් කරුවන් 8 දෙනෙකුට වෙළඳපොල අවස්ථාවක් ලබා දීමට කටයුතු කර ඇත.





## 2.17 අන්තර්ජාතික පිළිගැනීම

ගෝලීය වශයෙන් නව නිපැයුම් සහ නවෝත්පාදන දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධව ලොව පිළිගත් අන්තර්ජාතික නව නිපැයුම්කරුවන්ගේ සංවිධානය (IFIA) හා ලෝක නව නිපැයුම් සහ බුද්ධිමය දේපල සංවිධානය (WIIPA) යන ජාත්‍යන්තර සංගම් දෙකෙහි සාමාජිකත්වය ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත හිමි වී ඇත. ඒ හරහා කොමිසමේ ජාත්‍යන්තර සබඳතා තවදුරටත් වර්ධනය වී ඇත.

මෙම සාමාජිකත්වයන් ලබාගැනීම තුලින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට යොවුන්, විවෘත, කාන්තා යනාදී වූ විවිධ කාණ්ඩයන් නියෝජනය කරන ජාත්‍යන්තර නව නිපැයුම් තරඟ රැසකට සහභාගී වීමේ දුර්ලභ අවස්ථාව හිමි වී ඇත. මෙම සංවිධාන මඟින් සිදු කරන සේවාවන් ලෙස පුහුණු වැඩසටහන් පැවැත්වීම, නව නිපැයුම් වාණිජකරණය, බුද්ධිමය දේපළ අයිතිය සුරැකීම, පරිසර හිතකාමී නව නිපැයුම් ප්‍රවර්ධනය සහ නව නිපැයුම් මෙන්ම නව නිපැයුම්කරුවන්ගේ ව්‍යාපෘති සඳහා ප්‍රචාරණය ලබාදීම සිදු කරන අතර, ඔවුන් ගේ වෙබ් අඩවි හා සඟරා වැනි මුද්‍රිත මාධ්‍ය හරහා ද නව නිපැයුම් පිළිබඳ නවතම තොරතුරු ප්‍රචාරණය සිදු කරනු ලබයි. එමෙන්ම ජයග්‍රාහී නව නිපැයුම් සඳහා පදක්කම් හා ත්‍යාග මුදල් ද ප්‍රදානය කිරීම ද විශේෂත්වයකි.

ඒ හැරුණු විට තරඟ සඳහා ගුවන් ටිකට්පත්, නවාතැන් පහසුකම් වෙනුවෙන් අනුග්‍රහ දැක්වීම මෙන්ම නව නිපැයුම් ප්‍රදර්ශන සඳහා ලියාපදිංචිය, ප්‍රදර්ශන කුටි සැපයීම හා ප්‍රවාහන පහසුකම් සම්පාදනය යනාදී කටයුතු වල දී සහනශීලීව කටයුතු කිරීම මඟින් ද සහයෝගය ලබාදෙයි. මෙම දිරිගැන්වීම් සහ පිළිගැනීම් ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන්ට ඔවුන් ගේ නව නිපැයුම් දේශීය හා විදේශීය වෙළෙඳපළ තුල වාණිජකරණය කිරීම වැනි කටයුතු සඳහා මහඟු පිටුවහලකි.

මෙම ජාත්‍යන්තර සංගම්වල අනුග්‍රහය මත කොමිසම වෙත ලැබෙන පහසුකම් ඔස්සේ සහසක් නිමැවුම් තරඟයේ ජයග්‍රාහකයින් ලොව පුරා පැවැත්වෙන ජාත්‍යන්තර නව නිපැයුම් තරඟ අත්දැකීම ලබාගැනීමට සුදුසුකම් ලබයි.

## 2.18 ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය

දේශීය නව නිපැයුම්කරුවන් ඇගයීම වෙනුවෙන් "නව නිපැයුම්කරුවන්ට වෙන්වූ දිනයක්" නම් කිරීමේ අවශ්‍යතාවය මත, අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් 2016 වසරේ සිට සෑම වසරකම ඔක්තෝබර් මස 26 වන දිනය "ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය" ලෙසින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම දිනයෙහි සුවිශේෂීතාවය වන්නේ විශිෂ්ට ගණයේ සිවිල් ඉංජිනේරුවරයෙකු, නව නිපැයුම්කරුවෙකු සහ ඉංජිනේරුමය ආයතන කිහිපයකම ප්‍රාරම්භකයා වූ එමෙන්ම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ප්‍රථම කොමසාරිස් ධූරය හෙබ වූ දේශබන්දු ආචාර්ය ඒ. එන්. එස්. කුලසිංහ මැතිතුමා ගේ ජන්ම දිනය එදිනට යෙදී තිබීමයි.

2023 වර්ෂය සඳහා ද ඔක්තෝබර් 26 දින ජාතික නවනිපැයුම්කරුවන්ගේ දිනය උත්සවාකාරයෙන් සමරනු ලැබින. එහිදී "සහසක් නිමැවුම් - 2022" තරඟයේ ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග ප්‍රධානොත්සවය පැවැත්වීම, අධ්‍යාපන අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමන්, රාජ්‍ය අමාත්‍යවරුන් ඇතුළු නවනිපැයුම්කරුවන් රාශියක ගේ සහභාගීත්වයෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී පවත්වනු ලැබින. එහිදී 2023 වසරේ කැපී පෙනෙන දක්ෂතා දැක්වූ නව නිපැයුම් සමාජය ද ඇගයීමට ලක්කෙරින.

## 2.19 නව නිපැයුම් ප්‍රචලිත කිරීමේ වෙනත් වැඩසටහන්

### 2.19.1 "Sri Lanka Inventors" - YouTube ප්‍රවේශය

වාණිජකරණය සඳහා යෝග්‍ය දේශීය නව නිපැයුම් විධිමත්ව ලෝකයට විවෘත කිරීම හරහා නව නිපැයුම්කරුවන්ට අභිමානය ලඟා කර දීමත්, දෙස් - විදෙස් ආයෝජකයන් වෙතින් එම නිපැයුම් වාණිජකරණයට සහාය ලබාගැනීමත් අරමුණු කරගනිමින් නවීන තාක්ෂණය ආශ්‍රයෙන් ලෝකය සමඟ ඉදිරියට ගමන් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර දීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ නව වැඩසටහනකි. එමෙන්ම නවක නිපැයුම්කරුවන්ට නවෝත්පාදනය පිළිබඳව දැනුවත්භාවයක් ලබාගැනීමටත්, පේටන්ට් බලපත්‍රය සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය ඇතුළු බොහොමයක් තොරතුරු පිළිබඳව නිසි අවබෝධයක් කඩිනමින් සහ ඕනෑම අවස්ථාවක ලබාගැනීමටත් මෙම චැනලය හරහා අවකාශ සලසා දී තිබේ.

ඒ අනුව එම යූ ටියුබ් නාලිකාව තුල වීඩියෝ 100 කට වඩා වැඩි ප්‍රමාණයක් සහ ග්‍රාහකයින් 1200 ක් දැනටමත් ඇතුලත්ව තිබීම සතුටුදායක ප්‍රගතියකි.

2023 වර්ෂය තුල නැරඹුම් 11,037 සහ වැනලය සඳහා එක්වීම් (Subscribers) 115 ඇත.

### 2.19.2 "Inventor Champs" නවෝත්පාදන ප්‍රවේශයේ පාසල් වේදිකාව

"Inventor Champs" යනු පාසල් අධ්‍යාපනයේ නිරත, 6 සිට 13 ශ්‍රේණිය දක්වා වූ වයස් කාණ්ඩයේ නිර්මාණශීලී පාසල් දූවා දරුවන් වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම හා "ශ්‍රද්ධා" මාධ්‍ය ජාලය එක්ව සංවිධානය කරන රූපවාහිනී වැඩසටහන යි. දරුවන් ගේ නවෝත්පාදන හැකියාවන් හඳුනාගනිමින් ඔවුන් නව නිපැයුම්කරණයෙහි දිරිගැන්වීමටත්, එතුලින් අප ගේ මාතෘභූමිය තුල නව නිපැයුම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණු අතර වේ.

වැඩසටහනේ ස්වභාවය අනුව අයදුම්පත් කැඳවීම හරහා තෝරා ගැනෙන නව නිපැයුම් වෙනුවෙන් මැදිරි කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම බුද්ධිමය දේපළ අයිතිය (පේටන්ට්) ආරක්ෂා කිරීම සඳහා පියවර ගැනීම අනිවාර්ය අංගයක් වන අතරම, ඒ සඳහා ද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ සහයෝගය දරුවන්ට හිමි වේ.

මූලික වටය සහ අවසන් පූර්ව තරඟ වටයන් හරහා අවසන් මහ තරඟයට නව නිපැයුම් 10ක් තෝරා ගන්නා අතර, එහි දී ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන වශයෙන් විශිෂ්ටතම නව නිපැයුම් තෝරාගනු ලබයි.

මෙම තරඟය හරහා දරුවන් ගේ තාක්ෂණික දැනුම ඉහළ නංවාගැනීම සඳහා වැඩමුළු, ක්ෂේත්‍ර චාරිකා, කුසලතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කෙරෙන අතර, නව නිපැයුම් වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික බිජෞෂණාගාර පහසුකම් ද ලබා දේ. එමෙන්ම ජයග්‍රාහකයින් වෙනුවෙන්, වටිනා ත්‍යාග, කුසලාන හා සහතික පත් පිරිනැමෙනවා මෙන්ම එම නව නිපැයුම් වෙළෙඳ පොළ වෙත යොමු කිරීමට අවශ්‍ය වටපිටාව නිර්මාණය කිරීම ද වැඩසටහන හරහා සිදුවේ.

ඒ අනුව මෙම වසරේ දී පාසල් වෙතින් කළ විවෘත අයදුම්පත් කැඳවීම හරහා නව නිපැයුම්/නව අදහස් 170ක් හඳුනා ගන්නා ලදී. එම නිපැයුම්/අදහස් අවසන් නිර්මාණයක් දක්වා වැඩිදියුණු කිරීම වෙනුවෙන් තාක්ෂණික උපදෙස් සැසියක් වැඩසටහනේ සමාරම්භක අවස්ථාවේදී එනම් 2023.10.14 දින කඩුවෙල පිහිටි "ශ්‍රද්ධා" රූපවාහිනී පරිශ්‍රයේ දී පැවැත්වීමට කටයුතු කරන ලදී. තව ද මෙම දරුවන් සඳහා නවෝත්පාදන විෂය සමගාමී වැඩමුළුවක් 2023.11.16 වන දින, ජා-ඇල පිහිටි ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ (නර්ඩ්) දී ද පවත්වන ලදී. අතරින් පළාත් මට්ටමේ විනිශ්චයන් හරහා නව නිපැයුම් 90ක් තෝරාගැනීමට නියමිත අතර, "Inventor Champs" රූපවාහිනී තරඟ වේදිකාවට පිවිසීමට අවස්ථාව ලැබෙන්නේ එම නිර්මාණ හිමිකරුවන්ට ය.








නර්ඩ් ආයතනයේ දී පැවැති වැඩමුළුවේදී
සිසුන්ට 3D තාක්ෂණය පිළිබඳ දැනුම ලබාදුන් අවස්ථාව




## 2.20 මාධ්‍ය දායකත්වය

ශ්‍රී ලංකාව තුල නවෝත්පාදන සංස්කෘතියක් බිහිකිරීම උදෙසා දේශීය නව නිපැයුම් ප්‍රචලිත කිරීමේ අවශ්‍යතාවය සපුරාලීම වෙනුවෙන් මාධ්‍ය ප්‍රචාරණයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. එබැවින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සෑම විටම ප්‍රචාරණ මාධ්‍ය (විද්‍යුත්, මුද්‍රිත හා සමාජ මාධ්‍ය) සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතර, නවෝත්පාදන ප්‍රචලිත කිරීම සඳහා ස්වෙච්ඡා සහයෝගය මාධ්‍ය වෙතින් ලබාගැනීමට ක්‍රියා කරයි.

## 2.21 SLIC-SPAR Sri Lanka ව්‍යාපෘතිය

දේශීය නව නිපැයුම්කරුවන් හඳුනාගනිමින්, එම නිපැයුම් වැඩිදියුණු කිරීමට සහයෝගය ලබාදෙමින්, ඔවුන්ගේ නව නිපැයුම් සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළ ප්‍රවේශය සකස් කරදීමේ අරමුණ පෙරදැරිව මෙම ව්‍යාපෘතිය අරම්භ කරන ලදී. මේ වන විට එම අරමුණ යථාර්ථයක් බවට පත්කර ගැනීමට කොමිසම සමත් වී ඇති අතර මෙහිදී නව නිපැයුම්කරුවන් සිව්දෙනෙකුගේ නිෂ්පාදන 14ක් වෙළඳපළට හඳුන්වා දී ඇති අතර මේ වන විට එම නිපැයුම් සාර්ථකව වෙලඳපල ජය ගනිමින් පවතී.






## 2.22 මෙහෙවර පියස මාසික පොළ

දේශීය නව නිපැයුම්කරුවන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සහ නව නිපැයුම් ජනතාව අතර ප්‍රචලිත කිරීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් නව නිපැයුම්කරුවන්හට ඔවුන්ගේ නව නිපැයුම් අලෙවි කිරීම සඳහා මේ වන විට අවස්ථාව ලබාදී ඇති අතර 2023 වර්ෂයේ ජූනි මස සිට දේශීය නව නිපැයුම්කරුවන්හට මෙහෙවර පියස ගොඩනැගිල්ලෙහි පවත්වනු ලබන මාසිකපොළ වෙත මේ වන විට සහභාගී වන අතර මෙහිදී නව නිපැයුම්කරුවන් 05දෙනෙකු ඔවුන්ගේ නිපැයුම් සාර්ථකව අලෙවිකරණ අතර මෙමගින් ඔවුන් රු.620,000ක මාසික ආදායමක් ලබා ගැනීමට ඔවුනට හැකිවී ඇත.





## 2.23 ආහාර තාක්ෂණයට අදාල නව නිපැයුම් වාණිජකරණය

ආහාර තාක්ෂණයට අදාල නව නිපැයුම් වාණිජකරණයට සහ ඔවුන්ගේ නව නිපැයුම් ජනතාව අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම IDA –WP සමඟ නව ව්‍යාපෘතියක් 2023 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලදි. මූලික අවස්ථාවේ තෝරාගත් නව නිපැයුම් 07ක් මේ වන විට මාදිවල වෙළඳ ප්‍රදර්ශනාගාරය වෙත හඳුන්වා දී ඇති අතර ඉදිරියේදී ආහාර තාක්ෂණයට අදාල නව නිපැයුම් රැසක් මෙම ව්‍යාපෘතිය ඔස්සේ වාණිජකරණයට කොමිසම අපේක්ෂා කරයි.

## 2.24 සතුටු පවුල වෙළඳ ප්‍රදර්ශනය

දේශිය ව්‍යාපාරිකයන්ගේ ප්‍රදර්ශන කුටි 200 කට අධික සංඛ්‍යාවක් සහ අධ්‍යාපන ප්‍රදර්ශන කුටි 100 කට අධික සංඛ්‍යාවක් ඇතුලත්ව කිරිදිවැල නගරය කේන්ද්‍ර කර ගනිමින් 2023 දෙසැම්බර් මස 25 සිට 31 දක්වා පැවතුණු සතුටු පවුල අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් වාණිජ මට්ටමේ නව නිපැයුම් කරන ලද නව නිපැයුම්කරුවන් 18 දෙනෙකුට නොමිලේ සහභාගි වීමට අවස්ථාව සලසා දෙන ලදී. මෙම දින 07 කාල සීමාව තුළ නව නිපැයුම්කරුවන්ගේ නිෂ්පාදන දේශිය පාරිභෝගිකයන් වෙත හඳුන්වා දීමට හා අලෙවි කිරීමට අවස්ථාව සැලසුණ අතර මෙමගින් දේශීය නව නිපැයුම්කරුවන්හට රුපියල් මිලියන 3.2 ඇණවුම් සහ විකුණුම් ලබාදීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට හැකි විය. තව ද ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට දේශීය නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් පිළිබඳ ප්‍රචාරණය ලබාදීමට ද මෙම වැඩසටහන මඟින් හැකි වූ අතර මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ සහය නොඅඩුව ලැබුණි.



## 2.25 පේටන්ට්ලාභී නව නිපැයුම්කරුවන් වෙනුවෙන් 2023 වසරේදී ලබාදුන් සහයෝගයන්

ජාතික බුද්ධිමය දේපල කාර්යාලය මගින් **2023** වසර තුළ නිකුත් කරන ලද පේටන්ට් බලපත්‍ර **27**ක නව නිර්මාණ සඳහා අවස්ථා හතරකදී කොමිසම මගින් නව නිර්මාණකරුවන් හමුවී එම නිර්මාණ වැඩිදියුණු කිරීම හා වාණිජකරණ අවස්ථාවන් වෙත යොමු කරවීමට අවශ්‍ය සහයෝගයන් පිළිබඳව සාකච්ඡා කරන ලදි. එහිදී **16** දෙනෙකු අදාල සහයෝගයන් ලබා ගැනීම සඳහා ඉදිරිපත් වූ අතර එයින් හතර දෙනෙකු සඳහා මේ වන විටත් අදාල සහයෝගයන් ලබාදී තිබේ. තව ද නව නිපැයුම්කරුවන් **8** දෙනෙකු ඔවුන්ට අවශ්‍ය සහයෝගයන් පිළිබඳව කොමිසම දැනුවත් කර ඇති අතර ඒ වෙනුවෙන් අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරෙමින් පවතී.

## 2.26 වාණිජකරණය කරන ලද නව නිර්මාණ 2023 වර්ෂයේදී ලැබූ ප්‍රගතිය

වර්ෂ 2012දී කොමිසම විසින් ආරම්භ කරන ලද සහසක් නිමැවුම් නව නිපැයුම් සහ නවෝත්පාදන ජාතික තරඟාවලිය තුලදී හඳුනා ගන්නා ලද නව නිපැයුම්කරුවන් වර්තමානය වන විට දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා දායක වෙමින් සිටියි.

කොමිසම මඟින් නව නිපැයුම් වාණිජකරණය සඳහා බුද්ධිමය දේපළ අයිතිය සුරක්ෂිත කරගත් නව නිර්මාණකරුවන්ට විවිධ සහයන් ලබාදී තිබේ. මූල්‍ය සහාය, ජාත්‍යන්තර වෙළඳපොළ අවසථා, ජාත්‍යන්තර ඇගයීම, දේශීයව නව නිර්මාණ ප්‍රවර්ධනය හා විකුණුම් අවස්ථා උදාකර දීම.

පර්යේෂණ වාර්තා ලබා ගැනීම් තත්ත්ව සහතික කරවා ගැනීම ද ඒ අතර වේ. එහිදී එස් ජේ. සමරසේකර නව නිපැයුම්කරුට **Smart Power Guard** නව නිර්මාණය සඳහා ඉහත සඳහන් කල පහසුකම් කොමිසම මඟින් ලබාදුන් අතර 2023 වර්ෂය සඳහා පමණක් ඔහුගේ වාණිජකරණය කරන ලද නව නිර්මාණය තුළින් රු. 6,260,247ක ආදායමක් උත්පාදනය කර ගැනීමට හැකිවිය.




තව ද ආසිරි දිල්හාන් ද සිල්වා නම් නව නිර්මාණකරුගේ නව නිර්මාණ හයක් විවිධ අවස්ථාවන් වලදී කොමිසම මගින් ඉහත සහයෝගයන් ලබාදී තිබෙන අතර එම නිර්මාණ හය 2023 වර්ෂයේදී 2,057,490 ක විකුණුම් ප්‍රමාණයක් සිදුකර තිබේ.






කෘෂි කර්මාන්තය සඳහා භාවිතා වන **"Seeder with fertilizer applicator"** නව නිපැයුම කරන ලද ජයවර්ධන වීරසිංහ නව නිපැයුම්කරු ඔහු විසින් නිෂ්පාදනය කරන ලද යන්ත්‍ර 45ක ප්‍රමාණයක් තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාදාමය මගින් ජයග්‍රහණය කර කෘෂිකර්මාන්ත අමාත්‍යාංශයට රු. මිලියන 36.3ක මුදලකට ලබාදෙන ලදි.

මෙම ව්‍යාපෘතිය මගින් දේශීය කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයට මහත් ශක්තියක් ලැබුණ අතරම විදේශ වලින් අදාල යන්ත්‍රය ආනයනය කිරීම නතර වූ අතර දේශීය මුදල් පිටරට වලට යෑම නැවැත්වීම ද සිදු විය.





"දසිස්" සම්මානලාභී නව නිපැයුම්කරුවකු වන ඩී. කේ. මහීපාල මහතා 2023 වර්ෂය තුල ඔහුගේ නව නිපැයුමක් වන අතින් ක්‍රියාත්මක වන කජු නිෂ්පාදන යන්ත්‍රය අපනයනය කිරීම මඟින් ඇමෙරිකානු ඩොලර් 20,000ක මුදලක් රටට ලබාදීමට සමත්විය. එයට අමතරව මෙවැනි යන්ත්‍ර රාශියයක් දේශීය වෙළඳපොළ තුල අලෙවි කිරීම මඟින් දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයටද දායකත්වයක් දක්වන ලදි.





## 2.27 මානව සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම දේශීය නව නිපැයුම්කරුවන් වෙනුවෙන් උපරිම සේවාවක් සැලසීම උදෙසා සුවිසල් මෙහෙවරක නිරත වන ආයතනයකි. නව නිපැයුම්කරුවන් වෙනුවෙන් ලබාදෙන එම සේවාව ගුණාත්මක හා කාර්යක්ෂමතාව ඉහළ සේවාවක් බවට පත් කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ ශක්‍යතාවය ඉහළ නැංවීම ද අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව, ඔවුන් විෂයානුබද්ධව විවිධ පුහුණු වැඩසටහනක් සඳහා යොමු කිරීමට කටයුතු කර ඇත. එහිදී ජාතික අයවැය චක්‍රලේඛ අනුව රාජ්‍ය වියදම් පාලනය අවම කිරීම සඳහා වන රෙගුලාසි හා චක්‍රලේඛ අනුව කටයුතු කරමින් කාර්ය මණ්ඩල පුහුණු සඳහා දේශිය පුහුණු අවස්ථා පමණක් ලබා දීමට කටයුතු කරන ලදි.


පහත දැක්වෙන්නේ 2023 වසර තුළ කාර්ය මණ්ඩල නිපුණතා සංවර්ධනය වෙනුවෙන් සහභාගීත්වය ලබා දුන් වැඩසටහන් පිළිබඳ තොරතුරු ය.

මාර්ගගත තාක්ෂණය ඔස්සේ (online) නිපුණතා සංවර්ධන අරමුදල මඟින් පවත්වනු ලැබූ "පරිපාලන නිලධාරී සතු වගකීම් හා කාර්යභාර්ය සම්බන්ධ වැඩමුළුව" සඳහා කොමිසමේ එක් නිලධාරියෙක් සහභාගී විය.

## 2.28 පෙර වසර 10ට අදාළ මූල්‍ය හා සම්බන්ධ සුවිශේෂී කරුණු

| වර්ෂය | මූල්‍ය තොරතුරු | |
|---|---|---|
| | වෙන් කළ මුදල | වියදම් මුදල |
| 2023 | 35.00 | 5.93 |
| 2022 | 30.0 | 9.10 |
| 2021 | 17.5 | 10.64 |
| 2020 | 40.00 | 4.63 |
| 2019 | 90.00 | 69.78 |
| 2018 | 120.00 | 84.33 |
| 2017 | 100.00 | 85.43 |
| 2016 | 60.00 | 47.45 |
| 2015 | 53.35 | 25.55 |
| 2014 | 40.00 | 21.42 |


වගුව 01: පසුගිය වසර 10 තුළ මූල්‍ය සමාලෝචනය




රූප සටහන 02: වෙන් කළ මුදලට සාපේක්ෂව මූල්‍ය තත්ත්වය ප්‍රතිශතයක් ලෙස

| වැඩසටහන | 2023 | 2022 | 2021 | 2020 | 2019 |
| --- | --- | --- | --- | --- | --- |
| නව නිපැයුම්කරුවන්ට අධාර කිරීමේ ණය යෝජනා ක්‍රමය | - | - | 153,845.00 | - | - |
| IAFM | - | 50,440.00 | 72,000.00 | - | - |
| සේවක ඵලදායකත්වය ගොඩනැංවීම | 7,500.00 | 85,500.00 | 533,750.00 | 270,000.00 | 352,315.00 |
| තාක්ෂණික බීජෞෂණාගාර පිහිටුවීම | - | - | 59,545.00 | - | - |
| නව නිපැයුම්කරුවන් වාණිජකරණය කිරීම | 6,015.00 | 166,514.00 | 12,000.00 | - | - |
| පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පළාත් වැඩසටහන් | 360,818.50 | - | - | 1,541,962.50 | 5,641,214.07 |
| නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන ප්‍රවර්ධන වැඩසටහන | 1,488,402.00 | 4,736,745.56 | 636,657.45 | 904,194.00 | 7,305,455.45 |
| ජනාධිපති සම්මාන උළෙල | 550,830.00 | 74,000.00 | 110,110.73 | - | 18,000.00 |
| සහසක් නිමැවුම් ප්‍රදර්ශනය | 2,770,947.85 | 1,952,557.75 | 4,924,909.00 | 1,017,820.00 | 22,098,263.11 |
| නව නිපැයුම් සමාජ පිහිටුවීම | 15,510.00 | 1,520,000.00 | 2,993,863.00 | | 1,910,377.00 |
| පේටන්ට් අයදුම්කිරීම සඳහා සහාය ලබා ගැනීමේ ක්‍රමවේදය | 93,053.00 | 28,175.00 | - | 37,209.50 | 647,942.08 |
| FITI | - | 359,065.03 | 731,616.37 | 509,750.00 | - |
| විවිධ කර්මාන්ත ක්ෂේත්‍රයන්හි පැන නගින ගැටලු වෙනුවෙන් නවෝත්පාදන විසඳුම් ලබාදීම සඳහා වන වන ව්‍යාපෘතිය | - | 131,250.00 | 413,379.00 | 344,970.00 | - |
| ජාත්‍යන්තර ප්‍රදර්ශන | - | - | - | - | 20,121,249.67 |
| කොමිසමේ වෙබ් අඩවිය | - | - | - | - | 3,803.25 |
| Inventor champs | 636,352.50 | - | - | - | - |
| නව නිපැයුම්කරුවන්ගේ දිනය | - | - | - | - | - |
| Innova Minds | - | - | - | - | 365,730.00 |
| ශිල්පසේනා | - | - | - | - | 11,318,382.70 |
| | **5,929,428.85** | **9,104,247.34** | **10,641,675.55** | **4,625,906.00** | **69,782,732.33** |

| වැඩසටහන | 2018 | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|---|
| නව නිපැයුම්කරුවන්ට අධාර කිරීමේ ණය යෝජනා ක්‍රමය | - | - | - | - | - |
| IAFM | - | - | - | - | - |
| සේවක ඵලදායකත්වය ගොඩනැංවීම | 1,423,838.83 | 3,456,020.25 | 1,263,173.25 | 37,967.00 | 292,245.38 |
| තාක්ෂණික බීජෞෂණාගාර පිහිටුවීම | - | - | - | - | - |
| නව නිපැයුම්කරුවන් වාණිජකරණය කිරීම | - | - | 3,184,657.30 | - | 4,099,597.50 |
| පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පළාත් වැඩසටහන් | 4,330,859.25 | 3,648,065.09 | 2,445,926.95 | 2,321,961.51 | - |
| නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන ප්‍රවර්ධන වැඩසටහන | 12,364,874.79 | 11,566,054.30 | 1,541,187.75 | 88,420.00 | 1,847,704.09 |
| ජනාධිපති සම්මාන උළෙල | 3,666,072.00 | 548,605.00 | 4,006,728.74 | 472,004.89 | 2,161,368.64 |
| සහසක් නිමැවුම් ප්‍රදර්ශනය | 25,964,420.54 | 30,578,735.25 | 18,654,670.73 | 16,119,189.12 | 11,908,920.29 |
| නව නිපැයුම් සමාජ පිහිටුවීම | - | | - | 3,677,101.98 | 23,219.00 |
| පේටන්ට් අයදුම්කිරීම සඳහා සහාය ලබා ගැනීමේ ක්‍රමවේදය | 774,936.81 | 470,315.75 | 26,660.00 | - | - |
| FITI | - | - | - | - | - |
| විවිධ කර්මාන්ත ක්ෂේත්‍රයන්හි පැන නඟින ගැටලු වෙනුවෙන් නවෝත්පාදන විසඳුම් ලබාදීම සඳහා වන ව්‍යාපෘති | - | - | - | - | - |
| ජාත්‍යන්තර ප්‍රදර්ශන | 16,175,756.15 | 16,050,906.88 | 5,790,159.49 | 2,795,759.73 | 1,050,197.24 |
| කොමිසමේ වෙබ් අඩවිය | 21,122.28 | 21,122.28 | - | 37,887.59 | 38,071.26 |
| Inventor champs | - | - | - | - | - |
| නව නිපැයුම්කරුවන්ගේ දිනය | 8,501,653.55 | 5,833,221.99 | 662,500.00 | - | - |
| Innova Minds | 11,107,243.15 | 13,252,492.91 | 9,871,429.31 | - | - |
| ශිල්පසේනා | - | - | - | - | - |
| | **84,330,777.35** | **85,425,539.70** | **47,447,093.52** | **25,550,291.82** | **21,421,323.40** |


35.00
30.00
25.00
20.00
15.00
10.00
5.00
-
2023
2022
2021
2020
2019
2018
2017
2016
2015
2014
පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන් & පළාත් වැඩසටහන්
නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන ප්‍රවර්ධන වැඩසටහන
සහසක් නිමැවුම් ප්‍රදර්ශනය

### 3. සංයුතික පාලන වාර්තාව

i. 2023 වර්ෂය සඳහා කොමිසම විසින් පාලක මණ්ඩල රැස්වීම් 10ක් පවත්වා ඇත. කොමසාරිස් ධුරය පුරප්පාඩුව පැවතීම නිසා මැයි සහ ජුනි මාස 02 සඳහා පාලක මණ්ඩල රැස්වීම් 02ක් පැවැත්වීමට නොහැකි විය.

ii. 2023 වර්ෂය සඳහා කොමිසම විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ

- "සහසක් නිමැවුම්" නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනයේදී ආනයන ආදේශකයක් සඳහා වන හොඳම නව නිපැයුම, සාමාජීය බලපෑමක් කළහැකි හොඳම නව නිපැයුම සහ දිගුකාලීන පැවැත්මක් සහිත පරිසර හිතකාමී තාක්ෂණය හා ආර්ථික වටිනාකමක් සහිත හොඳම නව නිපැයුම යන නව නිපැයුම් හඳුනාගෙන ඒවා ඇගයීමට ලක් කරන ලෙස ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත.
- පාලක මණ්ඩලයේ ඒකඟතාවය මත ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව ශ්‍රී ලංකාවේ මාර්ග භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව සඳහා නව නිපැයුම් හඳුන්වාදීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදි.
- රජයේ වියදම් අවම කරගැනීම සඳහා අනුග්‍රාහකත්වයන් ලබා ගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ඒකාබද්ධව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් නව නිපැයුම්කරුවන්ට ලැබෙන ප්‍රතිලාභ වැඩිකිරීම.

4. මූල්‍ය ප්‍රකාශනය

**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම**
**මූල්‍ය තත්ත්ව විස්තරය**
**දෙසැම්බර් 31 න් අවසන් දිනට**

| | සටහන් | 2023 | 2022 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | **78,216,559** | 67,662,970 |
| උත්සව අත්තිකාරම් | | **-** | 1,250 |
| ණයගැතියෝ | 2 | **15,322,609** | 15,337,063 |
| ජාතික ආධුනිකත්ව සහ පුහුණු අධිකාරිය වෙතින් ලැබීම් | | **7,560** | 7,560 |
| වෙනත් අත්තිකාරම් | | **136,633** | 136,633 |
| ඉදිරියට කල ගෙවීම් | 3 | **580,614** | 520,856 |
| *(අඩු කළා) අඩමාන ණයකරුවන් සඳහා වෙන්කිරීම් (100%)* | 4 | **(9,602,964)** | (9,602,964) |
| වෙනත් ලැබිය යුතු දෑ | | **7,100** | 167,930 |
| නැවත ලැබිය යුතු තැන්පතු | 5 | **7,000** | 2,407,000 |
| ආපදා ණය | | **925,187** | 805,962 |
| COVID 19 වැඩසටහන යටතේ ලබාදුන් ණය | | **460,634** | 646,960 |
| නව නිපැයුම්කරුවන්ගේ අරමුදල යටතේ ලබාදුන් ණය | | **606,313** | 754,820 |
| IAFM-SL ව්‍යාපෘතිය යටතේ ලබාදුන් ණය | | **1,160,400** | 2,660,400 |
| ඉන්ධන තැන්පතු | | **150,000** | 100,000 |
| ටී ෂර්ට් තොග | 6 | **-** | 320,280 |
| ලිපි ද්‍රව්‍ය තොග | 6 | **484,001** | 595,115 |
| | | **88,461,646** | **82,521,836** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| නව නිපැයුම්කරුවන්ගේ අරමුදල යටතේ ලබාදුන් ණය | | **578,828** | 1,180,141 |
| IAFM-SL ව්‍යාපෘතිය යටතේ ලබාදුන් ණය | | **2,512,200** | 3,672,600 |
| ආපදා ණය | | **2,330,664** | 2,499,927 |
| දේපළ, පිරියත හා උපකරණ | 7 | **26,396,518** | 39,780,730 |
| | | **31,818,211** | **47,133,397** |
| **මුළු වත්කම්** | | **120,279,857** | **129,655,233** |

| | | | |
|---|---|---|---|
| **අරමුදල් සහ බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | | | |
| ණයහිමියෝ | 8 | **1,171,664** | 2,160,664 |
| උපචිත වියදම් | 9 | **5,142,844** | 7,146,531 |
| | | **6,314,508** | 9,307,195 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| මහාවැලි ව්‍යාපෘතිය සඳහා වෙන්කිරීම් | 10 | **6,555,425** | 6,558,705 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 11 | **5,406,337** | 4,423,824 |
| IAFM-SL ව්‍යාපෘතිය | 12 | **36,472,155** | 36,472,155 |
| තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම | 13 | **22,930,703** | 30,426,293 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | 14 | **3,867,728** | 5,304,071 |
| නව නිපැයුම්කරුවන්ගේ අරමුදල | 15 | **12,837,184** | 12,837,184 |
| **මුළු බැරකම්** | | **94,384,040** | **105,329,427** |
| **ශුද්ධ වත්කම්** | | **25,895,817** | **24,325,806** |
| **ශුද්ධ වත්කම්/ හිමිකම්** | | | |
| සම්මුච්චිත අරමුදල | | **4,395,817** | 2,825,806 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | **21,500,000** | 21,500,000 |
| **මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්** | | **25,895,817** | **24,325,806** |

සියළු අඩු කිරීම් වරහන් තුළ පෙන්නුම් කරයි.

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 6 සිට 15 දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකායෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

ඩී. ඒ. සරත්චන්ද්‍ර
සහකාර අධ්‍යක්ෂ (මුදල්)

එන්. එන්. ඩබ්. දොලවත්ත
අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි.

මෙම මූල්‍ය ප්‍රකාශය සැකසීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

මෙම මූල්‍ය ප්‍රකාශය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත පරිදි අත්සන් තැබේ.

එස්. කේ. සිරිල් සුදුවැල්ල
කොමසාරිස්

කල්පනී රාජපක්ෂ
සහකාර කොමසාරිස්

ඩී. ඩී. ආනන්ද නාමල්
සහකාර කොමසාරිස්

2024 පෙබරවාරි 26
කොළඹ

| | | | |
|---|---|---|---|
| ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම | | | |
| මූල්‍යමය කාර්ය සාධන ප්‍රකාශය | | | |
| **2024/12/31 න් අවසන් වර්ෂය සඳහා** | සටහන් | **2023** | **2022** |
| | | රු. | රු. |
| **ආදායම්** | | | |
| රජයේ දායකත්වය | | | |
| රජයේ දායකත්වය - පුනරාවර්තන | 16 | 43,023,000 | 49,400,000 |
| ව්‍යාපෘති / වැඩසටහන් | 20 | 5,921,929 | 9,018,748 |
| සේවක එලදායකත්වය ගොඩනැංවීම | | 7,500 | 85,500 |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ස්ථාවර වත්කම් | 7 | 5,556,914 | 5,567,670 |
| තාක්ෂණ බිජෞෂණාගාර - යන්ත්‍ර හා උපකරණ | 7 | 7,495,590 | 7,495,590 |
| වෙනත් ආදායම් | 17 | 639,658 | 1,638,282 |
| **මුළු ආදායම** | | **62,644,590** | **73,205,790** |
| **වියදම්** | | | |
| පුද්ගලික පඩිනඩි | 18 | 18,995,451 | 20,692,859 |
| ආයතන හා පරිපාලන වියදම් | 19 | 22,506,555 | 24,871,009 |
| ක්ෂය - ස්ථාවර වත්කම් | 7 | 13,052,503 | 13,063,259 |
| පාරිතෝෂික | 11 | 1,578,608 | 554,030 |
| නව නිපැයුම්කරුවන් දිරි දිරි ගැන්වීමේ වියදම් | 20 | 5,921,929 | 9,018,748 |
| වෙනත් වියදම් | 21 | 600,130 | 13,436 |
| **මුළු වියදම්** | | **62,655,176** | **68,213,342** |
| **වසර සඳහා අතිරික්තය / (හිඟය)** | | **(10,586)** | **4,992,448** |

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 6 සිට 15 දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකායෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| | සටහන් | ප්‍රත්‍යාගණන අතිරික්තය රු. | සමුච්චිත අරමුදල රු. | මුළු ස්කන්ධය රු. |
|---|---|---|---|---|
| 2022 ජනවාරි 01 දිනට ශේෂය | | 21,500,000 | (2,382,643) | 19,117,357 |
| අවලංගු කරන ලද චෙක්පත් | | | 216,000 | 216,000 |
| 2022 වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය) | | - | 4,992,449 | 4,992,449 |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | 21,500,000 | 2,825,806 | 24,325,806 |
| *පෙර වර්ෂයේ ගැලපීම් - 2022* | | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ස්ථාවර වත්කම් | | | (14,205) | (14,205) |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය (නැවත සකස් කරන ලද)** | | **21,500,000** | **2,811,601** | **24,311,601** |
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | | 21,500,000 | 2,811,601 | 24,311,601 |
| පෙර වර්ෂයේ අවලංගු කරන ලද චෙක්පත් | | | 1,594,803 | 1,594,803 |
| 2023 වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය) | | | (10,586) | (10,586) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **21,500,000** | **4,395,817** | **25,895,818** |

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 6 සිට 15 දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකායෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**2024/12/31 න් අවසන් වර්ෂය සඳහා**

| | සටහන් | 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| අතිරික්තය/හිඟය | | (10,586) | 4,992,449 |
| | | | |
| **මුදල් නොවන සංචලන** | | | |
| ක්ෂයවීම් | 7 | 13,052,503 | 13,063,259 |
| ව්‍යාපෘති / වැඩසටහන් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් වල වෙනස් වීම | 20 | (5,921,929) | (9,018,748) |
| සේවක එලදායකත්වය ගොඩනැංවීම සම්බන්ධ වෙනස්වීම් | | (7,500) | (85,500) |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ස්ථාවර වත්කම් | | (13,052,503) | (13,063,259) |
| පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම් | 11 | 1,578,608 | 554,030 |
| අපහරණයෙන් ලද අලාභය | | 314,105 | 13,436 |
| අපහරණයෙන් ලද ලාභය | | (18,102) | - |
| **ගැලපීම් :** | | | |
| ණයගැතියන්වෙනස්වීම | | - | (3,940,183) |
| ලිපි ද්‍රව්‍ය තොග වෙනස්වීම් | | 111,114 | (208,255) |
| ටී ෂර්ට් තොග වෙනස්වීම් | | 320,280 | 94,200 |
| ඉදිරියට කල වියදම් හි වෙනස්වීම | 3 | (59,758) | 947,797 |
| උත්සව අත්තිකාරම් හිවෙනස්වීම | | 1,250 | - |
| ගෙවිය යුතු වියදම් හි වෙනස්වීම | | (2,003,687) | 4,944,558 |
| නැවත ගෙවීමේ තැම්පතු | | 2,400,000 | - |
| ඉන්ධන නැම්පතු | | (50,000) | - |
| අනෙකුත් ලැබිය යුතු දෑ හි වෙනස්විම් | | 160,830 | (167,930) |
| ණයහිමියන්ගේ වෙනස්වීම | | (989,000) | 844,000 |
| | | (4,174,377) | (1,030,147) |
| පරිතෝෂික ගෙවීම් | | (596,095) | (267,265) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(4,770,472)** | (1,297,412) |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහ** | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | 7 | - | (441,068) |
| මහවැලි ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද වියදම් | | (3,280) | (564,212) |
| වත්කම් විකිණීම | | 21,500 | 1,000 |
| ණය නැවත ගෙවීම් -නව නිපැයුම්කරුවන්ගේ අරමුදල් | | 161,000 | 12,000 |
| IAFM-SL වැඩසටහන යටතේ ලබා දුන් ණය නැවත ගෙවීම | | 3,450,000 | 2,136,800 |
| ආපදා ණය ප්‍රදාන | | (1,028,480) | (543,474) |
| ආපදා ණය නැවත ගෙවීම | | 1,078,518 | 1,108,042 |
| වැරදි නිවැරදි කිරීම් | | - | (54,973) |
| අවලංගු කරන ලද චෙක්පත් | | 1,594,803 | 216,000 |
| පෙර වර්ෂයට අදාලව මුදල් ලැබීම් | | - | 49,520 |
| IAFM-SL වැඩසටහන යටතේ ලබා දුන් ණය/ප්‍රදාන | | - | (5,950,000) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **5,274,060** | (4,030,365) |
| **මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන | | 10,050,000 | 10,070,000 |
| මහවැලි ව්‍යාපෘතිය | | - | 588,891 |
| **මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **10,050,000** | 10,658,891 |
| **වසර තුළදී ශුද්ධ මුදල් හා මුදල් සමාන දේ (වැඩි වීම/ අඩු වීම)** | | 10,553,589 | 5,331,114 |
| **වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දේ** | | 67,662,970 | 62,331,856 |
| වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දේ | | **78,216,559** | **67,662,970** |
| **මුදල් හා මුදල් සමාන දේ විශ්ලේෂණය** | | | |
| A/C No.033-1-001-0-1791066 | | 24,429,746 | 19,799,754 |
| A/C No.033-1-001-2-1791065 | | 51,530,220 | 45,510,115 |
| A/C No.204402131791066 | | 2,256,593 | 2,353,101 |
| | | 78,216,559 | 67,662,970 |

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 6 සිට 15 දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකායෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

අයවැය හා සංචිතයන් සංසන්දනය කිරීම

රු.

| | අනුමත අයවැය | | මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කරන ලද අරමුදල් | |
|---|---|---|---|---|
| | **2023** | 2022 | **2023** | 2022 |
| පුනරාවර්තනය | **50,000,000** | 50,500,000 | **43,023,000** | 49,400,000 |
| ප්‍රාග්ධනය | **35,000,000** | 30,000,000 | **10,050,000** | 10,070,000 |
| ඒකතුව | **85,000,000** | 80,500,000 | **53,073,000** | 59,470,000 |

| වර්ෂය | රජයේ දායකත්වය ප්‍රාග්ධනය (ශ්‍රී. ලං. රු) |
|---|---|
| 1991 | 163,050 |
| 1992 | 1,700,000 |
| 1993 | - |
| 1994 | 250,000 |
| 1995 | 196,000 |
| 1996 | 113,500 |
| 1997 | 757,000 |
| 1998 | 1,700,000 |
| 1999 | 290,000 |
| 2000 | 4,500,000 |
| 2001 | 2,870,000 |
| 2002 | 700,000 |
| 2003 | 2,500,000 |
| 2004 | 621,000 |
| 2005 | 5,997,000 |
| 2006 | 33,991,000 |
| 2007 | 37,100,000 |
| 2008 | 24,106,000 |
| 2009 | 15,765,000 |
| 2010 | 4,500,000 |
| 2011 | 6,151,010 |
| 2012 | 21,562,000 |
| 2013 | 17,061,000 |
| 2014 | 40,000,000 |
| 2015 | 30,269,992 |
| 2016 | 57,248,655 |
| 2017 | 73,133,822 |
| 2018 | 85,750,000 |
| 2019 | 58,000,000 |
| 2020 | 24,538,000 |
| 2021 | 7,900,000 |
| 2022 | 10,070,000 |
| 2023 | 10,050,000 |

## 1. කොමිසමේ තොරතුරු

### 1.1 ආයතනයේ වාර්තාව

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම් දිරි ගැන්වීමේ පනත යටතේ නව නිපැයුම් දිරිගැන්වීම , ප්‍රවර්ධනය හා නිෂ්පාදන සහ ඒ සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.

කොමිසම ක්‍රියාත්මක වන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය යටතේය.

2023 වර්ෂයේ කොමිසමේ කාර්යාලය, 05 වන මහල, මෙහෙවර පියස ගොඩනැගිල්ල, කොළඹ 05 හි පිහිටා ඇත.

## 2. සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම වන්නේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතින්ට අදාලව ව්‍යවස්ථාපිත අවශ්‍යතා සඳහා වේ.

### 2.1 අනුකූලතා ප්‍රකාශනය

විගණකාධිපති සහ මූල්‍ය හා සැලසුම් අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ කමිටුව විසින් නියම කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිසමේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදි.

මෙම මූල්‍ය ප්‍රකාශන වල පහත සඳහන් අංශ ඇතුලත් වේ.

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- මූල්‍යමය කාර්ය සාධන ප්‍රකාශනය
- ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලය සතු වගකීමකි.

### 2.3 ඇගයීම් කිරීමේ පදනම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මත සකස් කර ඇති අතර උද්ධමන සාධක සඳහා කිසිදු වෙන්කිරීමක් සිදු කර නොමැත.

### 2.4 ව්‍යවහාර මුදල් ඉදිරිපත් කිරීම හා ක්‍රියාකාරිත්වය

කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය ආයතනයේ ක්‍රියාකාරී මුදල් වේ. මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කෙරේ.

### 2.5 ප්‍රමාණාත්මක බව, හිලව් කිරීම, වැටයීම් කිරීම

2.5.1 ප්‍රමාණාත්මක බව

සමාන අයිතමයන්හි ප්‍රමාණාත්මක අගයන් මූල්‍ය ප්‍රකාශයන්හි වෙන් වෙන්ව දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම පිලිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති 1 මගින් අවසර ලබා දී ඇති පරිදි ප්‍රමාණාත්මක නොවන අයිතමයන් ඒවායේ ස්වරූපය හා ක්‍රියාකාරීත්වයේ අසමානතාවය පදනම් කරගනිමින් වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශ දක්වා ඇත.

2.5.2 හිලව් කිරීම

රාජ්‍ය අංශයට ගිණුම්කරණ ප්‍රමිති වලට අවශ්‍ය පරිදි අවසර දී ඇත්නම් මූල්‍ය ප්‍රකාශන වලින් වත්කම් වගකීම් ආදායම් වියදම් හිලව් කිරීම නොකරයි.

2.5.3 වැටයීම් කිරීම

මූල්‍ය ප්‍රකාශන වල ඇති මුදල අසාන්තම රුපියල් වලට එකතු කර ඇත.

2.6 සැලකිලිමත් වීම

කොමිසමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ අදාළ කරුණු පදනම් කරගෙන වේ.

2.7 වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවීම්

වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවීම් යනු වාසිදායක හා අහිතකර සිදුවීම් වන අතර ඒවා වාර්තා කිරීමේ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරණ ලද දිනය අතර වේ.

මේ සම්බන්ධයෙන් මෙම වර්ෂය සඳහා වාර්තා කිරීමේ කාලයෙන් පසුව කිසිදු සිදුවීමක් නොමැත.

3. **විදේශ මුදල් ගණුදෙනු**

ගණුදෙනු සිදුකරන අවස්ථාවේ පවත්නා විනිමය අනුපාතය අනුව සියළුම විදේශ විනිමය ගණුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය වේ.

4. **දේපල හා උපකරණ**

4.1 හඳුනා ගැනීමේ පදනම

දේපල හා උපකරණ යනු සේවා සඳහා හෝ පරිපාලනමය අරමුණු සඳහා තබා ඇති ස්පර්ශ අයිතම වන අතර ඒවා වසරකට වැඩි කාලයක් තුල භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

4.2 ඇගයීමේ පදනම

වත්කමක් ලෙස පිලිගැනීමට සුදුසුකම් ලබන දේපල හා උපකරණ අයිතමයක් මුලින් මනිනු ලබන්නේ එහි පිරිවැයෙනි. පිරිවැයට වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපනය වන වියදම් සහ එහි කොටසක් එකතු කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන පිරිවැය ඇතුලත් වේ.

මිලදී ගන්නා ලද අදාල උපකරණ වල ක්‍රියාකාරිත්වයට අත්‍යවශ්‍ය වන පරිගණක මෘදුකාංග වැනි දෑ එම උපකරණ වල කොටසක් ලෙස ප්‍රාග්ධනීත කර ඇත.

දේපල හා උපකරණ වල කොටස් වලට විවිධ ප්‍රයෝජනවත් ජීවිත කාලය ඇති විට, ඒවා දේපල හා උපකරණ වල වෙනම අයිතම (ප්‍රධාන කොටස්) ලෙස ගණන් ගැනේ.

අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සඳහා විවිධ මූල්‍ය කාලසීමාව තුළ ලාභය හෝ අලාභය ප්‍රකාශනයට ගලපනු ලැබේ.

පවත්නා වත්කම් වල මෑතකදී තක්සේරු කරන ලද කාර්යසාදනයේ ප්‍රමිතියට වඩා අනාගත ආර්ථික ප්‍රතිලාභය වැඩි නම් ප්‍රතිසංස්කරණය මගින් හඳුනා ගත හැකි කොටසක් ප්‍රතිස්ථාපනය කරයි.

අදාල වත්කම් වල ඉතිරිව ඇති ප්‍රයෝජනවත් කාලය තුල ප්‍රධාන අලුත්වැඩියාවන් ක්ෂය කරනු ලැබේ.

## 4.3 ප්‍රත්‍යාගණනය

2021 දෙසැම්බර් 31 දින සිට වාහන කාණ්ඩයේ වත්කම් සඳහා නැවත තක්සේරු කිරීමේ ආකෘතිය භාවිතා වේ. එම පන්තියේ වත්කම් ඒවායේ සාධාරණ වටිනාකමට ඉදිරියට ගෙන යනු ලැබේ. ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තය සංචිතයට ගලපා ඇත.

## 4.4 බැහැර කිරීම

දේපළ හා උපකරණ භාවිතා කිරීමෙන් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට එම වත්කම් බැහැර කිරීම සඳහා හඳුනා ගනී. බැහැර කිරීමෙන් හඳුනා ගන්නා වත්කම් වලින් ඇතිවන ලාභය හෝ අලාභය එම වර්ෂයේ ලාභ අලාභ ප්‍රකාශනයේ වෙනත් ආදායම් හෝ වෙනත් වියදම් ලෙස ගලපනු ලැබේ. (වත්කම් බැහැර කිරීමේ ලාභය හෝ අලාභය ගණනය කරනු ලබන්නේ ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ වත්කම් රැගෙන යාමේ මුදල අතර වෙනස ලෙසයි.)

## 4.5 ක්ෂය

දේපල උපකරණ අයිතම වල එක් එක් කොටස් හි ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීවිත කාලය සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කර ලාභ අලාභ ප්‍රකාශනයේ ක්ෂය වීම් ලෙස දක්වා ඇත.

වත්මන් හා සන්සන්දනාත්මක වසර සඳහා ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත පරිදි වේ.

| වත්කම් පන්තිය | වාර්ෂික අනුපාතය | කාලය |
|---|---|---|
| ගෘහ භාණ්ඩ උපකරණ | 5% - 10% | 10-20 |
| කාර්යාලයීය උපකරණ | 10% - 20% | 05-10 |
| මුලාකෘති සැලසුම් සහ නාම පුවරු | 6 2/3% | 15 |
| මෝටර රථ හා වාහන | 20% | 05 |
| ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ කැමරා | 10% | 10 |
| රූපවාහිනී සහ වීඩියෝ කැසට් රෙකෝඩර් | 12.5% | 08 |
| කාර්යාලයීය සවිකුරු | 10% | 10 |
| තාක්ෂණ බීජෞෂණාගාර උපකරණ හා පිරිවිතර | 20% | 05 |

2014 ජනවාරි 01 වන දින සිට වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 7 භාවිතා කෙරේ.

4.6 සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල හා උපකරණ.

මූල්‍ය තත්ත්වයේ දිනය වන විටත් භාවිතයේ පවතින කොමිෂන් සභාවේ සම්පූර්ණයෙන් ක්ෂය වූ දේපල හා උපකරණ වල පිරිවැය පහත පරිදි වේ.

| දෙසැම්බර් 31 න් අවසන් දිනට | 2023 (රු.) | 2022 (රු.) |
|---|---|---|
| ගෘහ භාණ්ඩ උපකරණ | 421,580 | 489,885 |
| කාර්යාලයීය උපකරණ | 1,128,872 | 3,256,497 |
| ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ කැමරා | - | 1,127,435 |
| රූපවාහිනී සහ වීඩියෝ කැසට් රෙකෝඩර් | 107,850 | 107,850 |
| එකතුව | 1,658,302 | 4,981,667 |

4.7 සක්‍රීය භාවිතයෙන් ඉවත් කරන ලද දේපල උපකරණ

කොමිෂන් සභාවේ පහත සඳහන් දේපල හා උපකරණ වාර්තා කරන දිනට සක්‍රීය භාවිතයෙන් ඉවත් කරන ලදී.

| දෙසැම්බර් 31 න් අවසන් දිනට | 2023 (රු.) | 2022 (රු.) |
|---|---|---|
| ගෘහ භාණ්ඩ උපකරණ | - | 19,750 |
| කාර්යාලයීය උපකරණ | - | 194,000 |
| මූලාකෘති සැලසුම් සහ නාම පුවරු | - | - |
| කාර්යාලයීය සවිකුරු | 38,000 | 38,000 |
| එකතුව | 38,000 | 251,750 |

## 5. විස්තර කරන ලද දායක සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

අදාල ප්‍රතිපත්ති හා රෙගුලාසි වලට අනුකූලව සේවකයන්ගේ අර්ථ සාධක අරමුදල් දායකත්වය සහ සේවක භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයින් සුදුසුකම් ලබයි.

සේවක අර්ථසාධක අරමුදල කොමිසමෙන් 15% ක් සහ සේවකයන්ගෙන් 10% ක් සේවකයන්ගේ දළ වැටුපෙන් දායක වේ.

සේවකයන්ගේ දළ වැටුපෙන් 3% ක් කොමිසම සේවක භාර අරමුදලට දායක වේ.

## 6. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

<u>පාරිතෝෂිතය</u>

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනතට අනුකූලව සේවකයින්ට ගෙවිය යුතු පාරිතෝෂිත දීමනා සඳහා සේවයේ පළමු වසරේ සිට ගිණුම්වල ප්‍රතිපාදන සලසා ඇත.

## 7. අරමුදල්

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට රජයේ දායකත්වය, රජයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව අයිතම 02ක් යටතේ සපයනු ලැබේ.

1. පුනරාවර්ථන වියදම් සඳහා අරමුදල්
2. ප්‍රාග්ධන වියදම් සඳහා අරමුදල්

කොමිසමේ පුනරාවර්තන වියදම් පහත සඳහන් පරිදි ආදයම් හා වියදම් ගිණුමේ දක්වා ඇත.

1. ආයතන හා පරිපාලන වියදම්
2. පෞද්ගලික වේතන

ප්‍රාග්ධන වියදම් නියෝජනය කරනු ලබන්නේ 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරි ගැන්වීමේ පනතේ අරමුණු සපුරාලීම සඳහා කොමිසම විසින් කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා වන වියදමයි.

## 8. මුදල් ප්‍රවාහය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති 02 අනුව වක්‍ර ක්‍රමයට සකස් කර ඇත.

## 9. අරමුදල් එකතු කිරීම/ අනුග්‍රාහකයින්ගෙන් සහ තෙවන පාර්ශවයකින් ලැබෙන පරිත්‍යාග

කොමිසමේ ප්‍රතිපාද ගිණුම මඟින් පෙන්නුම් කරනුයේ අනුග්‍රහකයින්ගෙන් සහ තෙවන පාර්ශවයන්ගෙන් රැස් කරන ලද අරමුදල් වේ.

## 10. එකතු කිරීමේ අරමුදල් / අනුග්‍රාහකයින් සහ තෙවන පාර්ශවයන්ගෙන් පරිත්‍යාග

කොමිසම විසින් ප්‍රතිපාදන ගිණුමක් හරහා කොමිසම වෙත අනුග්‍රාහකයින් සහ තෙවන පාර්ශවයන්ගෙන් ලැබෙන අරමුදල් රැස් කර ගනිමින් එවා ප්‍රතිපාද ගිණුම හරහා ගිණුම් ගත කරනු ලැබේ.

<u>අදාළ පාර්ශ්ව හෙළිදරව් කිරීම</u>

කොමිෂන් සභාව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය - SLPSAS 14 - 'ආශ්‍රිත පාර්ශව හෙළිදරව් කිරීම්' හි අදාළ පාර්ශ්වයන් ලෙස අර්ථ දක්වා ඇති පාර්ශ්ව සමඟ ගනුදෙනු සිදු කරන ලදී.

<u>ප්‍රධාන කළමනාකරණ පාර්ශව (KMP) සමඟ ගනුදෙනු</u>

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව - SLPSAS 14 - 'ප්‍රධාන කළමනාකරණ පාර්ශව' යනු ආයතනයේ පාලන අධිකාරියේ සියලුම අධ්‍යක්ෂවරුන් හෝ සාමාජිකයන් වන අතර ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම ඇති අනෙකුත් පුද්ගලයින් වේ. ඒ අනුව කොමිසමේ කොමසාරිස්, සහකාර කොමසාරිස්වරුන් සහ අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරි) කොමිසමේ KMP ලෙස වර්ග කර ඇත.

S. K. සිරිල් සුදුවැල්ල මහතා (සභාපති), කල්පනී රාජපක්ෂ මහත්මිය (සහකාර කොමසාරිස්), ඉංජිනේරු. ඩී.ඩී.ආනන්ද නාමල් (සහකාර කොමසාරිස්) කොමිසමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට කොමිසමේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ලෙස එන්.එන්.ඩබ්ලිව්. දොල්ලවත්ත මහතා කටයුතු කරනු ලැබේ.

ප්‍රධාන කළමනාකාරීත්වයේ සේවකයින්ට ලබා දෙන වේතන හා දීමනාවන්.

| දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා | 2023<br>LKR | 2022<br>LKR |
|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට වැටුප් | **1,503,743** | **1,335,893** |
| | | |
| අධ්‍යක්ෂකවරයා සඳහා වැටුප් | **2,026,514** | **1,940,923** |
| | | |
| **එකතුව** | **3,530,257** | **3,276,816** |

ප්‍රධාන කළමනාකරණ පාර්ශව (KMPs) සම්බන්ධ ගනුදෙනු

| දෙසැම්බර් 31 දිනට | 2023<br>LKR | 2022<br>LKR |
|---|---|---|
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඇති අයිතම | | |
| ස්ථාවර වත්කම් හා ණය | **234,888** | **196,217** |
| ප්‍රකාශයේ ඇති ලාභ හෝ අලාභ | | |
| පොළී ආදායම් | **8,759** | **9,300** |

ඉහත කරුණු වලට අමතරව කොමිෂන් විසින් අධ්‍යාක්ෂවරයා (CEO) වෙත කොමිසමේ සංචිත වාහනයක් ද ලබා දී ඇත.

| | 2023 | 2022 |
|---|---|---|
| | රු. | රු. |
| **1 මුදල් හා මුදල් සමාන දෑ** | | |
| මුදල් පොත - 033100101791066 | 24,429,746 | 19,799,754 |
| මුදල් පොත - 033100121791065 | | |
| තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම | 13,762,138 | 13,762,138 |
| IFMSL ව්‍යාපෘතිය | 30,137,415 | 26,687,415 |
| නව නිපැයුම්කරුවන්ගේ අරමුදල | 7,630,667 | 5,060,562 |
| මුදල් පොත - 204402131791066 (විදේශ මුදල් ) | 2,256,593 | 2,353,101 |
| **දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය** | **78,216,559** | 67,662,970 |
| **2 ණයගැතියෝ** | | |
| රිෂාන් දුලංජන | 620,511 | 316,631 |
| C. දසනායක | 653,800 | 691,800 |
| S. රණසිංහ | 248,732 | 245,698 |
| සාගරිකා උපමාලි | 114,900 | 128,256 |
| උදයසිරි | 366,666 | 366,666 |
| දිශාන්ත ප්‍රේමනාත් | 422,787 | 224,847 |
| නිලන්ත ගුණසිංහ | 487,930 | 267,930 |
| සමන් හෙට්ටිආරච්චි | 599,000 | 497,352 |
| තුලිත සිහනිදු | 1,740,600 | 580,200 |
| රෝහන් බැසිල් නිශ්ශංක | - | 100,000 |
| ජයවර්ධන | 950,000 | 2,800,000 |
| වෙනත් ණයගැතියන් - කාර්යසාධනය නොවන | 9,117,683 | 9,117,683 |
| **දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය** | **15,322,609** | 15,337,062 |
| **3 ඉදිරියට කරන ලද ගෙවීම්** | | |
| ඉදිරියට කරන ලද ගිවිසුම්ගත සේවාවන් | 580,614 | 520,856 |
| **දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය** | **580,614** | 520,856 |

**4 අඩමාණ ණයකරුවන් සඳහා 100% වෙන් කිරීම**

| | | |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 9,602,964 | 9,602,964 |
| වර්ෂය සඳහා වෙන් කිරීම් | - | - |
| බොල් ණය | - | - |
| **දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය** | **9,602,964** | **9,602,964** |

**5 නැවත ලැබිය යුතු තැන්පතු**

| | | |
|---|---|---|
| ගැවින්රෝ ප්‍රොපර්ටි ඩිවලොපර්ස් | - | 2,400,000 |
| මෝබිටෙල් පුද්ගලික සමාගම | 2,000 | 2,000 |
| එක්ස්ප්‍රස් වෝටර් සිස්ටම් පුද්ගලික සමාගම | 5,000 | 5,000 |
| **දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය** | **7,000** | 2,407,000 |

**6 තොග ඇගයීම (ශ්‍රී. ල. රා. අ. ගි. ප්‍ර. අංක 09)**

වර්ෂය අවසානයේ ඇති ලිපි තොග (FIFO) ක්‍රමය පදනම් කරගනිමින් ශ්‍රී. ල. රා. ගි. ප්‍ර. අංක 09 අනුව ගණන් බලන ලදි

<u>ලිපි ද්‍රව්‍ය</u>

| | | |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 595,115 | 386,860 |
| වර්ෂය තුළ මිලදී ගැනීම් | 121,095 | 549,962 |
| වර්ෂය තුළ වියදම් | (232,209) | (341,707) |
| **දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය** | **484,001** | 595,115 |

<u>ටී - ෂර්ට්</u>

| | | |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 320,280 | 414,480 |
| වර්ෂය තුළ මිලදී ගැනීම් | - | - |
| වර්ෂය තුළ වියදම් | (320,280) | (94,200) |
| **දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය** | **-** | 320,280 |

**8 ගෙවිය යුතු වියදම්**

| | | |
|---|---|---|
| ණයහිමියෝ | 1,171,664 | 2,160,664 |
| **දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය** | **1,171,664** | 2,160,664 |

**9 Accrued Expenses**

| | | |
|---|---|---|
| ගෙවිය යුතු පිරිසිදු කිරීමේ සහ සනීපාරක්ෂක වියදම් | 64,806 | 12,558 |
| ගෙවිය යුතු ජල ගාස්තු | 15,234 | 10,562 |
| ගෙවිය යුතු විදුලිය ගාස්තු | 166,302 | 210,295 |
| ගෙවිය යුතු දුරකථන ගාස්තු | 66,300 | 41,592 |

| | | |
|---|---|---|
| ගෙවිය යුතු ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය | 167,283 | 24,400 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 1,262,700 | 1,089,800 |
| ගෙවිය යුතු අතිකාල දීමනා | 170,825 | 9,841 |
| ගෙවිය යුතු කොන්ත්‍රාත්තුමය සේවා සඳහා ගෙවීම් | - | 171,077 |
| සහසක් නිමැවුම් ප්‍රදර්ශනය සඳහා ගෙවිය යුතු | - | 1,460,355 |
| ගෙවිය යුතු පරිතෝෂික දීමනා | - | 131,285 |
| ගෙවිය යුතු නව නිපැයුම් සමාජ වියදම් | - | 40,000 |
| ගෙවිය යුතුවෙනත් දීමනා | 16,500 | - |
| ගෙවිය යුතු ගමන් ගාස්තු | 25,030 | 350 |
| ගෙවිය යුතු කුලී වියදම | 2,334,000 | 2,334,000 |
| ගෙවිය යුතු ලිපි ද්‍රව්‍ය වියදම් | 7,114 | - |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු වියදම් | 1,675 | 1,725 |
| ගෙවිය යුතු පරිපාලන වියදම් | - | 1,559,191 |
| වෙනත්ගෙවිය යුතු දෑ | 845,075 | 49,500 |
| **දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය** | **5,142,844** | 7,146,531 |

**10 මහවැලි ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන**

| | | |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 6,558,705 | 6,534,026 |
| මහවැලි අධිකාරියෙන් ලද ප්‍රතිපදාන | | 588,891 |
| <u>ව්‍යාපෘති ක්‍රියාකරකම් සඳහා වූ වියදම්</u> | | |
| අලිවැට ව්‍යාපෘතිය සඳහා කරන ලද පරිපාලන වියදම් | (3,280) | (564,212) |
| **දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය** | **6,555,425** | 6,558,705 |

**11 පාරිතෝෂිත**

**<u>1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනත යටතේ අදාළ පාරිතෝෂිත ගණනය කිරීම් සිදු කර ඇත.</u>**

| | | |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 4,423,824 | 4,268,344 |
| වර්ෂය සඳහා වෙන් කිරීම් | 1,578,608 | 554,030 |
| වර්ෂය තුළ පාරිතෝෂිත ගෙවීම් | (596,095) | (398,550) |
| **දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය** | **5,406,337** | **4,423,824** |

**12 IAFM-SL ව්‍යාපෘතිය**

| | | |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 36,472,155 | 36,472,155 |
| වර්ෂය තුල ප්‍රදාන ලැබීම් | - | - |
| වර්ෂය තුල සිදුකරන ලද වියදම් | - | - |
| **දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය** | **36,472,155** | 36,472,155 |

**13 තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම**

| | | |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 30,426,293 | 37,921,883 |

| | | | |
|---|---|---|---|
| වර්ෂය තුල ප්‍රධාන ලැබීම් | | - | - |
| <u>තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම සඳහා වියදම්</u> | | | |
| ක්‍රමක් ක්ෂය කිරීම් - රජරට විශ්ව විද්‍යාලය | 5 | (3,648,242) | (3,648,242) |
| ක්‍රමක් ක්ෂය කිරීම් - රුහුණු විශ්ව විද්‍යාලය | 5 | (3,847,348) | (3,847,348) |
| **දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය** | | **22,930,703** | 30,426,293 |
| **14 ප්‍රාග්ධන ප්‍රදානයන්** | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | | 5,304,070 | 9,905,989 |
| වර්ෂය තුල ප්‍රධාන ලැබීම් | | 10,050,000 | 10,070,000 |
| ව්‍යාපෘති සඳහා සිදුකරන ලද වියදම් | 17 | (5,921,929) | (9,018,748) |
| සේවක එලදායකත්වය ගොඩනැංවීම | | (7,500) | (85,500) |
| ස්ථාවර වත්කම් සඳහා ක්‍රමක් ක්ෂය | 5 | (5,556,914) | (5,567,670) |
| **දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය** | | **3,867,728** | 5,304,070 |
| **15 නව නිපැයුම්කරුවන්ගේ ණය අරමුදල** | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | | 12,837,184 | 12,837,184 |
| වියදම් | | - | - |
| **දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය** | | **12,837,184** | 12,837,184 |
| **16 රාජ්‍ය දායකත්වය** | | | |
| රජයේ දායකත්වය පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත. | | | |
| <u>ශ්‍රී. ලං. ගි. ප්‍ර. 24ට අනුව</u> | | | |
| පුනරාවර්තන ප්‍රදාන | | 43,023,000 | 49,400,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන | | 10,050,000 | 10,070,000 |
| **අවසන් වර්ෂය සඳහා** | | **53,073,000** | 59,470,000 |

**7 ක්ෂය - ස්ථාවර වත්කම්**

| | කාර්යාලයීය උපකරණ | ගෘහ භාණ්ඩ උපකරණ | මුලාකෘති සැලසුම් සහ නාම පුවරු | වාහන | ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ කැමරා | රූපවාහිනී සහ වීඩියෝ කැසට් රෙකෝඩර් | කාර්යාලයී ය සවිකුරු | යන්ත්‍ර සූත්‍ර හා සවිකුරු ( තාක්ෂණ බිජෞෂණාගා ර ) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | | | | | | | - |
| 2021 ජනවාරි 01 දිනට ශේෂය | 10,793,257 | 2,569,590 | 211,305 | 21,500,000 | 2,290,994 | 946,400 | 226,175 | 37,477,948 | **76,015,672** |
| වර්ෂය තුළදී එකතුවීම් | 1,336,320 | 42,098 | - | - | 5,850 | - | - | - | **1,384,268** |
| වර්ෂය තුළදී අපහරණයන් | (27,000) | (944) | (110,805) | - | - | - | (18,880) | - | **(157,629)** |
| 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | 12,102,577 | 2,610,744 | 100,500 | 21,500,000 | 2,296,844 | 946,400 | 207,295 | 37,477,948 | 77,242,310 |
| වර්ෂය තුළදී එකතුවීම් | - | - | - | - | - | - | - | - | - |
| වර්ෂය තුළදී අපහරණයන් | (4,553,539) | (120,282) | - | - | (1,127,435) | - | - | - | **(5,801,256)** |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,549,038** | **2,490,462** | **100,500** | **21,500,000** | **1,169,409** | **946,400** | **207,295** | **37,477,948** | **71,441,054** |
| | | | | | - | | | - | |
| **සමුච්චිත ක්ෂය වීම** | | | | | | | | - | |
| 2022 ජනවාරි 01 දිනට ශේෂය | 7,401,787 | 1,409,846 | 157,813 | 0 | 1,521,377 | 646,818 | 85,669 | 13,318,204 | **24,541,514** |
| වර්ෂය තුළදී එකතුවීම් | 873,490 | 149,314 | 6,700 | 4,300,000 | 116,417 | 104,819 | 16,930 | 7,495,590 | **13,063,260** |
| අපහරණයන් | (22,133) | (588) | (110,805) | - | - | - | (9,668) | - | **(143,194)** |
| 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | 8,253,145 | 1,558,572 | 53,708 | 4,300,000 | 1,637,793 | 751,637 | 92,931 | 20,813,794 | **37,461,580** |
| වර්ෂය තුළදී එකතුවීම් | 14,205 | - | - | - | - | - | - | - | **14,205** |
| 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය (නැවත සකස් කරන ලද) | 8,267,350 | 1,558,572 | 53,708 | 4,300,000 | 1,637,793 | 751,637 | 92,931 | 20,813,794 | 37,475,785 |
| වර්ෂය තුළදී එකතුවීම් | 865,276 | 149,413 | 6,700 | 4,300,000 | 113,777 | 104,819 | 16,930 | 7,495,590 | **13,052,504** |
| අපහරණයන් | (4,247,241) | (109,078) | - | - | (1,127,435) | - | - | - | **(5,483,754)** |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **4,885,385** | **1,598,907** | **60,408** | **8,600,000** | **624,135** | **856,456** | **109,861** | **28,309,383** | **45,044,536** |
| **ශුද්ධ පොත් අගය** | | | | | | | | - | |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය (නැවත සකස් කරන ලද) | 3,835,227 | 1,052,172 | 46,792 | 17,200,000 | 659,051 | 194,763 | 114,364 | 16,664,154 | **39,766,525** |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **2,663,653** | **891,555** | **40,092** | **12,900,000** | **545,274** | **89,944** | **97,434** | **9,168,565** | **26,396,518** |

*** වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය 2022 ජනවාරි 01 සිට බලපැවැත්වෙන පරිදි වෙනස් කර ඇත.**

*** 2022 දෙසැම්බර් 31 දින සිට වාහන වත්කම් සඳහා ප්‍රති තක්සේරු කිරීමේ ආකෘතිය භාවිත කර ඇත. එම වත්කම් වල සාධාරණ වටිනාකමට ගෙන යනු ලැබේ. නැවත තක්සේරු කිරීමේ අතිරික්තය කොටස් වශයෙන් හඳුනාගෙන ඇත. අනෙකුත් වත්කම් ඉතා ඇවර කරන ලද වත්කම් නොවන නිසා ඓතිහාසික පිරිවැය ආකෘතිය යටතේ වටිනාකම පවතී.**

*** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය විසින් 253-2750 අංක දරණ වාහනය 2020 සැප්තැම්බර් 17 දින සිට කොමිසමේ භාවිතය සඳහා මාරු**

| | | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| **17** | **වෙනත් ආදායම්** | | |
| | ආපදා ණය - පොළිය | 140,036 | 160,948 |
| | විදේශ මුදල් - පොළිය | 45,322 | 42,359 |
| | සුළු ආදායම් | 37,022 | 230,534 |
| | විදේශ මුදල් ගණුදෙණු වල ලාභය | - | 1,026,742 |
| | සහසක් නිමැවුම් ලියාපදිංචි ගාස්තු | 390,070 | 173,042 |
| | නිෂ්පාදන භාගය | 9,106 | 4,657 |
| | අපහරණ ලාභ | 18,102 | |
| | | **639,658** | **1,638,282** |
| **18** | **පුද්ගලික පඩිනඩි** | | |
| | වැටුප් සහ වේතන | 10,429,388 | 11,375,474 |
| | ජීවන වියදම් දීමනාව | 1,948,813 | 2,188,561 |
| | වෘත්තිය දීමනාව | 193,144 | 169,288 |
| | වෙනත් දීමනා - පුහුණු සේවකයන් | 1,249,239 | 1,402,924 |
| | වෙනත් දීමනා | 338,000 | 393,000 |
| | ඉන්ධන වියදම් දීමනාව | 598,420 | 550,135 |
| | දුරකථන වියදම් දීමනාව | 114,696 | 123,000 |
| | සේවක අර්ථ සාධක අරමුදල | 1,856,730 | 2,034,605 |
| | සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 371,346 | 408,699 |
| | අතිකාල සහ නිවාඩු දින ගෙවීම් | 384,432 | 629,780 |
| | කොමිසමේ සාමාජිකයින් සඳහා පාරිශ්‍රමිකය ගෙවීම් | 1,503,743 | 1,331,893 |
| | සේවක ඵලදායකත්වය ගොඩනැංවීම | 7,500 | 85,500 |
| | | **18,995,451** | **20,692,859** |

| | | | |
|---|---|---|---|
| **19** | **ආයතන හා පරිපාලන වියදම්** | | |
| | දේශීය ගමන් වියදම් | 61,640 | 143,619 |
| | විදේශීය ගමන් වියදම් | 117,734 | - |
| | ලිපි ද්‍රව්‍ය | 260,378 | 353,065 |
| | ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය | 1,093,623 | 608,233 |
| | කාර්යාලයීය උපකරණ - අලුත්වැඩියාව සහ නඩත්තුව | 24,488 | 9,189 |
| | වාහන - අලුත් වැඩියාව සහ නඩත්තුව | 1,473,979 | 532,596 |
| | කාර්යාල - අලුත් වැඩියාව සහ නඩත්තුව | 1,242,864 | - |
| | තැපැල් ගාස්තු | 56,250 | 56,825 |
| | සන්නිවේදන ගාස්තු | 632,374 | 564,419 |
| | උපයෝගි වියදම් | 6,985 | 20,144 |
| | කොන්ත්‍රාත්තුමය වියදම් | 775,240 | 1,612,152 |
| | විදුලි ගාස්තු | 1,202,773 | 1,250,039 |
| | පිරිසිදු කිරීමේ වියදම් | 204,110 | 511,558 |
| | ජල ගාස්තු | 111,592 | 80,969 |
| | කුලී වියදම් | 14,004,000 | 14,834,000 |
| | සංග්‍රහ වියදම් | 147,489 | 244,592 |
| | Staff Welfare | 3,000 | - |
| | News Papers and Periodicals Expenses | 790 | - |
| | විගණන ගාස්තු | 410,500 | 319,300 |
| | මෙහෙයුම් කල්බදු වියදම් | - | 1,591,600 |
| | වෙනත් පරිපාලන වියදම් | 676,746 | 2,138,709 |
| | | **22,506,555** | **24,871,009** |
| **20** | **නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ වියදම්** | | |
| | නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන ප්‍රවර්ධන වැඩසටහන | 2,578,626 | 4,736,746 |
| | ජනාධිපති සම්මාන ප්‍රධාන උළෙල | 550,830 | 74,000 |

| | | |
|---|---|---|
| සහසක් නිමැවුම් ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය | 2,770,948 | 1,952,558 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම | - | 28,175 |
| නව නිපැයුම් සමාජ පිහිටුවීම | 15,510 | 1,520,000 |
| SLAAS - FITI - 2020 වැඩසටහන | - | 359,065 |
| කාලීන සමාජයීය ගැටළු සඳහා නවෝත්පාදන විසඳුම් වැඩසටහන | - | 131,250 |
| නව නිපැයුම්කරුවන් වාණිජකරණය කිරීම | 6,015 | 166,514 |
| IAFM-SL ව්‍යාපෘතිය | - | 50,440 |
| | **5,921,929** | **9,018,747** |

**21 වෙනත් වියදම්**

| | | |
|---|---|---|
| අපහරණ ලාභ (අනෙකුත් උපකරණ) | 314,105 | 13,436 |
| Loss on Foreign Currency Transaction | 286,025 | - |
| | **600,130** | **13,436** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMT/F/SLIC/1/23 /25 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 මැයි 28 දින

කොමසාරිස්,

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රත්පත්තිවලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිසමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 92 (ආ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවමත් භාවිතයට ගන්නා පිරිවැය වටිනාකම රු.1,469,302 ක් වූ වත්කම් සම්බන්ධයෙන් ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි.

(ආ) කොමිසම විසින් රු. 7,800 ක් වූ ජීවන වියදම් දීමනාව රු. 17,800 ක් ලෙස සලකා පාරිතෝශිත සඳහා වෙන් කිරීම් ගණනය කිරීම හේතුවෙන් පාරිතෝශිත වෙන්කිරීම් රු.905,002 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කොමිසමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිසමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

කොමිසමේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිසම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිසම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිසමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිසමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිසමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිසමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිසම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (අ) යටතේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිසම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිසමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර කොමිසමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
| --- | --- |
| 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම් පනතේ 11(1) ඊ ඡේදය | ශ්‍රී ලංකාවේ දී පේටන්ට් බලපත්‍ර දෙන ලද නව නිපැයුම් සඳහා නව නිපැයුම්කරුවන්ට ධෛර්ය දීම වෙනුවෙන් "නව නිපැයුම් පිළිබඳ ජනාධිපති ප්‍රදාන" ලබා දිය යුතු වුවත්, 2017 සිට 2023 දක්වා වසර 7 ක කාලයක් සඳහා ජනාධිපති ප්‍රදාන ලබා දී නොතිබුණි. |

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

## 2.3 වෙනත් කරුණු

(අ) නිසි ශක්‍යතා අධ්‍යනයක් හා සැලැස්මකින් තොරව ලැබෙන අයදුම්පත් හැසිරවීම සඳහා රු.4,600,000 ක මුදලක් වැය කර 2018 වර්ෂයේදී දත්ත පද්ධතියක් සකසා ඇතත් ස්ථාපිත කළ වර්ෂයේ සිට මේ දක්වා ලැබී ඇති මුළු අයදුම්පත් ගණන 39 ක් වූ අතර සමාලෝචිත වර්ෂය වන විට එවැනි දත්ත පද්ධතියක් ක්‍රියාකාරීත්වයේ නොතිබුණි.

(ආ) ණයගැති ශේෂය තුළ ඇතුලත් වසර 5 කට වැඩි රු.12,632,009 ක් හා වසර 3 ට වැඩි රු.1,740,600 ක් ලෙස එකතුව රු.14,372,609 ක් වූ ණය ශේෂ, ණය කොන්දේසි

ප්‍රබල නොවීම, පොදු කොන්දේසි මාලාවක් නොතිබීම හා ඇපකරුවන්ගේ තොරතුරු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ අරමුදලෙහි ශේෂය රු.12,837,184 ක් හා බීජෞෂණ මධ්‍යස්ථාන ඉදිකිරීම් සඳහා ලබා දුන් මුදලින් ඉතිරි මුදල වන රු.13,762,138 ක් පිළිවෙලින් 2017 හා 2020 වර්ෂවල සිට ජංගම ගිණුම තුළ නිශ්කාර්යව පැවතුණි.

(ඈ) 2021 වර්ෂයේ සිට පැවත එන, මහවැලි ව්‍යාපෘතියට අදාලව එකතුව රු.834,224 ක් වූ ණයහිමි ශේෂය හා පාසල් නව නිපැයුම් කව වෙනුවෙන් ලබා දී තිබූ රු.330,000 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වසර 05 කට වැඩි කාලයක සිට පැවත එන ගිවිසුම් ගත සේවාවන් සඳහා ඉදිරියට කළ ගෙවීම් ශේෂය රු.341,088 ක් සමාලෝචිත වර්ෂය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2023 ක්‍රියාකාරී සැලැස්මේ දත්ත පද්ධතියේ කළමණාකරණය සහ වෙබ් අඩවිය සංවර්ධනය හා ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම යන ක්‍රියාකාරකම් 02 ක සඳහා ඇස්තමේන්තුගත මුදල වූ රු. 9,000,000 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ දී කිසිදු ක්‍රියාකාරකමක් සිදු කර නොතිබුණි.

(උ) අධ්‍යාපන වෙළඳ ප්‍රදර්ශනයේ වියදම් වෙනුවෙන් දොම්පේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුව තිබූ රු. 500,000 ක මුදල ප්‍රාදේශීය සභාවේ නිල බැංකු ගිණුමට අයත් නොවන සංස්කෘතික හා ආගමික කමිටුව නමින් ගිණුමට බැර කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

**2023 - විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති කරුණු නිවැරදි කිරීම සඳහා කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග**

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම |
|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 92 (ආ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවමත් භාවිතයට ගන්නා පිරිවැය වටිනාකම රු.1,469,302ක් වූ වත්කම් සම්බන්ධයෙන් ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. | 2022.01.01 දින වත්කම් වල ඵලදායී ජීවිත කාලය යාවත්කාලින කිරීමට කටයුතු කර ඇති අතර ඔබ විසින් දක්වා ඇති වත්කම් වලට අයත් වත්කම් කාණ්ඩයෙහි සම්පූර්ණ ක්ෂය වූ වත්කම් වල ඵලදායි ජීවිත කාලය යාවත්කාලීන කලහොත් අසාමාන්‍ය ජීවිත කාල වැඩිවීමක් පෙන්නුම් කෙරේ. ඔබ සඳහන් කළ පරිදි වත්කම් වල ඵලදායී ජීවිත කාලය වැඩිකළ හොත් වත්කම් වල ක්ෂය වීම් අධි තක්සේරුවක් සිදුවේ. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම |
|---|---|
| කොමිසම විසින් රු. 7,800 ක් වූ ජීවන වියදම් දීමනාව රු. 17,800 ක් ලෙස සලකා පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් ගණනය කිරීම හේතුවෙන් පාරිතෝෂිත වෙන්කිරීම් රු.905,002 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිරීක්ෂණය පිලිගනිමි. 2024 වර්ෂයේ දී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

**1.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.4.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම |
|---|---|
| (අ) ණයගැති ශේෂය තුළ ඇතුළත් වසර 5 කට වැඩි රු.12,632,009ක් හා වසර 3 ට වැඩි රු.1,740,600 ක් ලෙස එකතුව රු.14,372,609 ක් වූ ණය ශේෂ, ණය කොන්දේසි ප්‍රබල නොවීම, පොදු කොන්දේසි මාලාවක් නොතිබීම හා ඇපකරුවන්ගේ තොරතුරු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ණය අයකර ගැනීම සඳහා ගත් උත්සාහයන් ,නීති නිලධාරියෙකුගේ උපදෙස් වලින් තොරව ඉදිරියට ගෙනයාම සිදුකල නොහැකි වූ අතර නව පත්වීම ලද නීති නිලධාරි මගින් ඉදිරි ක්‍රියා මාර්ග ගනු ඇත. |
| (ආ) වසර 05 කට වැඩි කාලයක සිට පැවත එන ගිවිසුම් ගත සේවාවන් සඳහා ඉදිරියට කළ ගෙවීම් ශේෂය රු.341,088 ක් සමාලෝචිත වර්ෂය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. |

### 1.5.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම |
|---|---|
| 2021 වර්ෂයේ සිට පැවත එන, මහවැලි ව්‍යාපෘතියට අදාලව එකතුව රු.834,224 ක් වූ ණයහිමි ශේෂය හා පාසල් නව නිපැයුම් කව වෙනුවෙන් ලබා දී තිබූ රු.330,000 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂයන් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතින් අවශ්‍ය අනුමැතීන් ලබාගැනීම සඳහා අවස්ථා 02කදී විද්‍යුත් තැපැල ඔස්සේ සහ තවත් එක් අවස්ථාවක ලිපියක් මගින් ද ලෙස අවස්ථා 03ක දී සිහි කැඳවීම් සිදුකර 2023.03.16 දිනැතිව තවත් ලිපියක් යොමුකර ඇත. ඒ අනුව කොමිසමේ පාර්ශවය වෙතින් ණයහිමි ශේෂයන් නිරවුල් කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතින් ඉදිරි ක්‍රියාමාර්ග ලබාගෙන නොතිබීම හේතුවෙන් ණයහිමි ශේෂයන් නිරවුල් කිරීම සඳහා කොමිසමට හැකියාවක් නොවීය. |

### 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම |
|---|---|
| භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ සංයුතිය - මෙම මණ්ඩලය කෙලින්ම ගබඩා භාරව සිටින නිලධාරියා හෝ නිලධාරීන් ද ඔහුට හෝ ඔවුන්ට ආසන්නම යටත් නිලධාරීන් ද හැර වෙනත් වගකිව යුතු නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද කොමිසම විසින් නිලධාරීන් 5 දෙනෙකුගෙන් යුත් සමීක්ෂණ මණ්ඩලයක් පත් කර තිබුණි. | නිරීක්ෂණය පිළිගතිමි .නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| රාජකාරි ඉටු කිරීම සඳහා ගමන් බිමන් යෑමට නියම වී ඇති රජයේ නිලධාරියෙකුට ආයතන සංග්‍රහයේ රෙගුලාසි ප්‍රකාරව ගමන් වියදම් ගෙවනු ලබන අතර රාජකාරි ගමන් බිමන් යා යුත්තේ ඒ ඒ අවස්ථාවේ දී පවතින තත්වය අනුව හැකි තරම් ඉක්මනින් යා හැකි ඉතාම කෙටි මාර්ගයෙන් හා ආණ්ඩුවට අඩුම වියදම දැරීමට සිදුවන පරිදි වුවත් ඊට පටහැනිව භාණ්ඩ සමීක්ෂණ සඳහා සහභාගීවන නිලධාරීන්ට කොමිසමේ වාහන පහසුකම් සලසා දී ඉන්ධන හා අනෙකුත් වියදම් වෙනුවෙන් පිළිවෙලින් රු.48,224ක් හා රු.56,488ක් වැය කර තිබුණි. | නිරීක්ෂණය පිළිගතිමි 2024 . වර්ෂයේදී එය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| ශ්‍රී ලංකාවේදී පේටන්ට් බලපත්‍ර දෙන ලද නව නිපැයුම් සඳහා නව නිපයුම්කරුවන්ට ධෛර්යය දීම වෙනුවෙන් වන නිපයුම් පිළිබඳ ජනාධිපති ප්‍රදාන ලබා දිය යුතු වුවත්,2017 සිට 2023 දක්වා වසර 7 ක කාලයක් සඳහා ජනාධිපති එම ප්‍රදාන ලබා දී නොතිබුණි. | මේ සඳහා 2023 ජූනි සිට ජනාධිපතිතුමන් වෙතින් දිනයක් ලබාගැනීම සඳහා විමසීම් කලද මේ දක්වා නිශ්චිත දිනයක් ලැබී නොමැත. එය කොමිසමේ පාලනයෙන් බැහැර සංසිද්ධියක් බව ද කාරුණිකව සටහන් කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම |
|---|---|
| නිසි ශක්‍යතා අධ්‍යනයක් හා සැලැස්මකින් තොරව ලැබෙන අයදුම්පත් හැසිරවීම සඳහා රු.4,600,000 ක මුදලක් වැය කර 2018 වර්ෂයේ දී දත්ත පද්ධතියක් සකසා ඇතත් ස්ථාපිත කල වර්ෂයේ සිට මේ දක්වා ලැබී ඇති මුළු අයදුම්පත් ගණන 39 වූ අතර සමාලෝචිත වර්ෂය වන විට එවැනි දත්ත පද්ධතියක් ක්‍රියාකාරිත්වයේ නොතිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි .මේ වන විට කොමිසමේ නිලධාරින් දත්ත පද්ධතිය පවත්වා ගෙනයාම සිදු කරනු ලබයි. |

3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම |
|---|---|
| අධ්‍යාපන වෙළඳ ප්‍රදර්ශනයේ වියදම් වෙනුවෙන් දොම්පේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු රු.500,000 ක මුදල ප්‍රාදේශීය සභාවේ නිල බැංකු ගිණුමට අයත් නොවන සංස්කෘතික හා ආගමික කමිටුව නමින් ගිණුමකට බැර කර තිබුණි. | දොම්පේ ප්‍රාදේශිය සභාවේ ලිපි ශීර්ෂය සහිතව ශාලා ගාස්තු , විදුලිය,ජලය, මේස පුටු සඳහා රු. 500,000 ක මුදලක් සඳහන් කර තිබූ අතර අදාල ගිණුම පිළිබඳ මහජන බැංකුවෙන් තහවුරු කර ගැනීමෙන් පසු චෙක්පතක් මාර්ගයෙන් ගෙවීමට කටයුතු කරන ලදී. |

**3.3** නිශ්කාර්යව **හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම |
|---|---|
| ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ අරමුදලෙහි ශේෂය රු.12,837,184 ක් හා බීජෞෂණ මධ්‍යස්ථාන ඉදිකිරීම් සඳහා ලබා දුන් මුදලින් ඉතිරි මුදල වන රු.13,762,138 ක් පිළිවෙලින් 2017 හා 2020 වර්ෂයේ සිට ජංගම ගිණුම තුළ නිශ්කාර්යව පැවතුණි. | නිරීක්ෂණය පිළිගනිමි. COVID 19, ආර්ථික ව්‍යසනය වැනි විවිධ හේතුමත ද, තාක්ෂණික බීජෞෂණාගාර මගින් නව නිපැයුම්කරුවන්ට සේවා ලබා දීමේ දීත් විවිධ ප්‍රයෝගික ගැටළු මතුවිය . එබැවින් මෙම මුදල වඩාත් ඵලදායීව නව නිපැයුම්කරුවන්ට සේවාවක් සැපයීම සඳහා වන යෙදවීමට ක්‍රම වේදයක් සකස් කිරීමට සාකච්ඡා කරමින් පවතී. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම |
|---|---|
| 2023 ක්‍රියාකාරී දත්ත පද්ධතියේ කළමණාකරණය හා වෙබ් අඩවිය සංවර්ධනය සහ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම යන ක්‍රියාකාරකම් 02 ක සඳහා ඇස්තමේන්තුගත මුදල වූ රු. 9,000,000 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ දී කිසිදු ක්‍රියාකාරකමක් සිදු කර නොතිබුණි. | නිරීක්ෂණයන් හා එකඟ වේ. 2023 වසරේ කාර්තුමය ප්‍රගති වාර්තා තුල අදාල ක්‍රියාකාරකම්හි අපේක්ෂිත ඉලක්කයන් සපුරාගැනීමට නොහැකි වූ හේතු සඳහන් කර ඇත. 2023 වසරට අනුමත වූ මුදල් නියමිත කාලයන් හි නොලැබුණි. |